වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சு

Ministry of Plantation Industries

2022

කාර්යසාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

Performance Report



කාර්යසාධන වාර්තාව 2022

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය



වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

11 වන මහල, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල

දුරකථන - 011 - 2186160
ෆැක්ස් - 011 - 2186076
වෙබ් අඩවිය - http://www.plantationindustries.gov.lk

සැකසුම : සැලසුම් අංශය

දුරකථන - 011- 2187070 (අධ්‍යක්ෂ ජනරාල්)
ෆැක්ස් - 011- 2187075
විද්‍යුත් තැපැල් ලිපිනය - mpiplanningdiv@gmail.com

ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකාවේ අපනයනාභිමුඛ වැවිලි කර්මාන්තය වැඩිදියුණු කරමින් දේශීය ආර්ථිකය නඟා සිටුවීම සඳහා ඉතා වැදගත් අංශ වන තේ, රබර්, පොල් සහ සුළු අපනයන භෝග වගාවන් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයන්හි ප්‍රවර්ධනය උදෙසා ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම සිදු කරමින් හා සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබා දෙමින් වැවිලි ක්ෂේත්‍රයේ ඉහළ කාර්යසාධනයක් ලඟා කර ගත හැකි වන පරිදි 2022 වර්ෂය තුළ දී ද අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන මෙහෙයවීමට හැකි වීම පිළිබඳව සතුටු වෙමි.

මෙම වර්ෂයේ දී රට තුළ පැවති රසායනික පොහොර අර්බුදය හා බලශක්ති අර්බුදය ආදී ගැටළුකාරී තත්ත්වයන් රැසක් මැද නැවත ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය කඩිනම් පියවර රජය විසින් ගැනීම හේතුවෙන් එම අර්බුද ක්‍රමානුකූලව කළමනාකරණය කොට වැවිලි ක්ෂේත්‍රයේ නිෂ්පාදන අඛණ්ඩතාව ධනාත්මකව පවත්වා ගැනීමට හැකි විය.

යටිතල පහසුකම් සංවර්ධනය කරමින් වගා බිම්වල පාංශු සංරක්ෂණය, පසේ ගුණත්වය වැඩි කිරීම, ජල කළමනාකරණය, පැළ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා සෘජු වගා ක්‍රමය සහ අස්වනු නෙලීමේ හා ප්‍රවාහනය කිරීමේ විධිමත් තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම මඟින් ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් වැවිලි ක්ෂේත්‍රයට සපයන ලදී.

අභියෝග ජය ගනිමින් අපනයනය ඉලක්ක කර ගත් භෝග ප්‍රවර්ධනය කිරීම හා අගය එකතු කළ නිෂ්පාදන සඳහා දේශීය හා විදේශීය වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගනිමින් ජාතික පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය 2022 වර්ෂයේ සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරන ලදී.

රටේ සෞභාග්‍යය උදෙසා මෙම මෙහෙවර ඉදිරියට ගෙන යමින් වැවිලි ක්ෂේත්‍රයේ නවීකරණය, සහන සැලසීම සහ අගය එකතු කළ නිෂ්පාදන දිරිගැන්වීම තුළින් අපනයන වෙළඳපොළ ජය ගැනීම සඳහා සහාය වන වත්මන් රාජ්‍ය අමාත්‍යතුමාට ද, හිටපු රාජ්‍ය අමාත්‍යවරුන්ට ද, හිටපු අමාත්‍යාංශ ලේකම්තුමා සහ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්ට ද, වත්මන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයට ද, අනුබද්ධ ආයතනවල ප්‍රධානීන්ට හා එම කාර්ය මණ්ඩලවලට ද, වැවිලි ක්ෂේත්‍රයට සම්බන්ධ සියළු පාර්ශ්වකරුවන්ට ද ශුභාශිංසන එක් කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

වෛද්‍ය රමේෂ් පතිරණ (පා.ම.)
වැවිලි කර්මාන්ත අමාත්‍ය

ගරු වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය



ජාත්‍යන්තර වෙළඳපොළ ජයගැනීම උදෙසා නූතන තාක්ෂණයෙන් පෝෂිත, ඉහළ අගය එකතු කිරීමක් සහිතව වැවිලි භෝග සංවර්ධනය සහ වගාකරුවන්ගේ ආදායම උසස් මට්ටමකට ගෙන එමින් රටට උපයන විදේශ විනිමය ප්‍රමාණය ඉහළ නැංවීම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යභාරය වේ.

ගෝලීය ආර්ථික ඉලක්කයන් තුළ ජාත්‍යන්තර වෙළඳපොළ ජය ගැනීම සඳහා නූතන තාක්ෂණයෙන් පෝෂිත අගය එකතු කරන ලද වැවිලි භෝග ක්ෂේත්‍රයක් ගොඩනැඟීම මෙහිදී ප්‍රමුඛ කාර්යය ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව 2022 වර්ෂය තුළ අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන විසින් වැවිලි ක්ෂේත්‍රයට අදාළව තම ආයතනයට පැවරී ඇති වගකීම් නොපිරිහෙලා ඉටුකරමින් ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කර ඇත.

වැවිලි ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධනයක් කරා යාමට වැවිලි ප්‍රජාවට වැවිලි භෝග සඳහා නව තාක්ෂණික ක්‍රම භාවිතය පිළිබඳ දැනුවත් කරමින් විශේෂයෙන් කාලගුණික විපර්යාස හේතුවෙන් ඇති වන බලපෑම අවම කිරීම සඳහා විසිරි ජල සම්පාදන, බිංදු ජල සම්පාදන සහ තෙතමන සංරක්ෂණ ක්‍රම හඳුන්වා දීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. එසේම තේ, පොල්, රබර් හා සුළු අපනයන භෝග ප්‍රධාන වැවිලි ආර්ථිකය පුනර්ජීවනය කිරීම සහ වැවිලි ක්ෂේත්‍රයේ විවිධාංගීකරණ වැඩපිළිවෙලක් සඳහා අවධානය යොමු කර ඇත.

වැවිලි ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් හා ඒ සඳහා ඇති අභියෝග ජය ගැනීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාගේ නායකත්වය සහ ආශීර්වාදය ගෞරවයෙන් යුතුව සිහිපත් කරන අතර, වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ලැබෙන සහයෝගය බෙහෙවින් අගය කරමි. එසේම වැවිලි ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් මා හට ඉටු කළ හැකි කාර්යභාරය නොපිරිහෙලා ඉටු කිරීමට කටයුතු කරමි.

ලොහාන් රත්වත්තේ (පා.ම.)
වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය

ලේකම්තුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා රජයේ ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව යමින් දේශීය මෙන්ම ජාත්‍යන්තර වෙළෙඳපළ ජයගැනීම උදෙසා නූතන තාක්ෂණයෙන් පෝෂිත, ඉහළ අගය එකතු කිරීමක් සහිත වූ වැවිලි භෝග සංවර්ධනය, වගාකරුවන්ගේ ආදායම උසස් මට්ටමකට ගෙන ඒම හා උපයන විදේශ විනිමය ප්‍රමාණය වර්ධනය කරගැනීම වැනි මූලික අරමුණු පෙරදැරි කරගෙන 2022 වර්ෂයේ අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීමට සැලසුම් කරන ලදී.

2022 වර්ෂය තුළ අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන විසින් වැවිලි ක්ෂේත්‍රයට අදාළව පැවරී ඇති වගකීම් නොපිරිහෙලා ඉටුකරමින් ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු ඉටුකරන ලදී. 2021 වර්ෂයේ මෙන්ම මෙම වර්ෂයේ ද ආරම්භයේ සිටම රට තුළ පැවති විවිධ ආර්ථික හා සමාජයීය අර්බුද කළමනාකරණය කරගනිමින්, විශේෂයෙන්ම වැවිලි ක්ෂේත්‍රය කෙරෙහි සෘජුව බලපෑ පොහොර ගැටළුව මෙන්ම අස්වැන්න නෙලීමේ හා ප්‍රවාහනය සඳහා අවශ්‍ය පහසුකම් දුර්වල වීම උපරිම ප්‍රමාණයකින් යථාවත් කිරීමට අදාළ නිසි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම හේතුවෙන් වැවිලි ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වා ගැනීමට අමාත්‍යාංශයට හැකිවිය.

වැවිලි ක්ෂේත්‍රයට අදාළව ඉදිරි ව්‍යාපෘති හඳුනා ගැනීමේදී විදේශ විනිමය ඉහළ නැංවීම, ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම, සෘජු හා වක්‍ර සේවා නියුක්තිය ඉහළ නැංවීම, පවත්නා වගාවේ ඵලදායීතාව ඉහළ නැංවීම වැනි කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමුකරමින් හා වගාකරුවන්ගේ ජීවන තත්ත්වය නැංවීමට ඉවහල් වන ව්‍යාපෘති හඳුනාගැනීම සඳහා ද වැඩි අවධානයක් මෙම වර්ෂය තුළ ද යොමු කර ඇත. අමාත්‍යාංශය මෙන්ම අනුබද්ධ ආයතන විසින් ද පැවති සීමාකාරී වාතාවරණය තුළ වුවද වැවිලි ක්ෂේත්‍රයට අදාළව තමන්ට පැවරී ඇති වගකීම් නොපිරිහෙලා ඉටුකරමින් ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කර ඇත.

ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ සහ ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ මහපෙන්වීම අනුව අමාත්‍යාංශය වෙත පැවරෙන කාර්යභාරය ඉටුකිරීම සහ වර්ෂයට අදාළව වැවිලි ක්ෂේත්‍රයට වෙන් වූ ප්‍රතිපාදන මත සෑහීමකට පත්විය හැකි ප්‍රගතියක් අත්කර ගැනීමට දායක වූ අමාත්‍යාංශයීය කාර්ය මණ්ඩලයට ද, අනුබද්ධ ආයතනයන්හි ආයතන ප්‍රධානීන් ඇතුළු කාර්යමණ්ඩලවලට ද මාගේ කෘතඥතාවය පිරිනමමි. වැවිලි භෝග හා ඒ ආශ්‍රිත නිෂ්පාදන තුළින් අපනයන ආදායම ඉහළ නංවාගැනීමටත්, ඒ තුළින් රට තුළ ශක්තිමත් ආර්ථිකයක් බිහි කිරීමටත් අමාත්‍යාංශයීය හා අනුබද්ධ ආයතනයන්හි කාර්ය මණ්ඩල ඇතුළු වැවිලි ක්ෂේත්‍රයේ සියලු පාර්ශවයන්ට අවශ්‍ය උපරිම ශක්තිය හා ධෛර්යය ලැබෙවායි ප්‍රාර්ථනය කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

ජානක ධර්මකීර්ති
ලේකම්

අන්තර්ගතය

01- පරිච්ඡේදය	ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය
02- පරිච්ඡේදය	ප්‍රගතිය හා ඉදිරි දැක්ම
03 - පරිච්ඡේදය	2022 වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය
04 - පරිච්ඡේදය	කාර්ය සාධන දර්ශක
05 - පරිච්ඡේදය	තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය
06 - පරිච්ඡේදය	මානව සම්පත් පැතිකඩ
07 - පරිච්ඡේදය	අනුකූලතා වාර්තාව

01. පරිච්ඡේදය

1. ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

වැවිලි කර්මාන්තයේ සංවර්ධනය මඟින් ජාතික සෞභාග්‍යය උදා කිරීම යන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දැක්ම පෙරදැරි කරගෙන විවිධ පර්යේෂණ විධික්‍රමයන්, නව තාක්ෂණික මෙවලම් හා ප්‍රශස්ථ භූමිය උපයෝජනය හරහා අගය එකතු කරන ලද නිෂ්පාදන විවිධාංගීකරණය තුළින් අපනයන වෙළඳපොළ ආකර්ෂණය කර ගැනීම ඉලක්ක කර ගනිමින් සමස්ත වැවිලි ක්ෂේත්‍රය නවමානයක් වෙත යොමු කිරීම 2022 වසරේ අභිප්‍රාය විය.

වසර දෙකක් මුළුල්ලේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හා රටේ පැවති ආර්ථික හා සමාජයීය අභියෝග හමුවේ වැවිලි ක්ෂේත්‍රය අරමුණු කරගත් ඉලක්ක වෙත ළඟා වීමේ බාධා ඇති වුව ද, එය අවම මට්ටමක් දක්වා කළමනාකරණය කරගනිමින් අපනයන ආදායම් වැඩි කර ගැනීමට උපරිම උත්සාහයක් දරන ලද වසරක් ලෙස 2022 වර්ෂය හඳුන්වා දිය හැකියි.

වර්ෂ 2022 මැයි 27 දිනැති අංක 2281/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව මෙතෙක් පැවති රාජ්‍ය අමාත්‍යාංශ ත්‍රිත්වය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට පැවරුණි. එසේම, මෙම විෂයය ක්‍රියාත්මකභාවය නැවත වරක් වර්ෂ 2022 ජූලි 22 දිනැති අංක 2289/43 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ද, තහවුරු කිරීමක් සිදු වුණි.

2022 වර්ෂයේ මුල සිටම රාජ්‍ය වියදම් දැඩිව පාලනය කර ගනිමින් අමාත්‍යාංශයේ සියළුම ක්ෂේත්‍රයන්හි ප්‍රගතිය අඛණ්ඩව පවත්වා ගැනීමට පියවර ගන්නා ලදී. එසේම අගය එකතු කිරීම තුළින් නිෂ්පාදන විවිධාංගීකරණය හා අපනයන සඳහා යොමු කිරීම, පර්යේෂණ තුළින් වැවිලි භෝගවල ඵලදාව වැඩි කර ගැනීමේ ක්‍රමවේද හඳුන්වා දීම සහ තාක්ෂණික නවෝත්පාදන තුළින් වැවිලි ක්ෂේත්‍රයේ කාර්මික සංවර්ධනයට දායක වීම මෙහිලා විශේෂ කොට සැලකිය හැකිය.

මෙම සියළු සාධක සැළකිල්ලට ගනිමින් වැවිලි අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන සඳහා ද නිසි මඟ පෙන්වීම ලබා දෙමින් වැවිලි ක්ෂේත්‍රයේ සියළුම පාර්ශවකරුවන් සම්බන්ධීකරණය කරමින් 2022 වර්ෂය සඳහා අත් කරගත් කාර්යසාධනය මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කර ඇත.

1.2 දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

“ වැවිලි කර්මාන්තයේ සංවර්ධනය මඟින් ජාතික සෞභාග්‍යය උදා කිරීම ”

මෙහෙවර

“ආර්ථික, සමාජයීය හා පාරිසරික වශයෙන් තහවුරු වූ වැවිලි කර්මාන්තයේ ඵලදායීතාව, ලාභදායීතාව සහ තිරසාරත්වය ඉහළ නැංවීම ”

අරමුණු

- සුවිශේෂී ජාත්‍යන්තර වෙළඳපොළ බඳ්ධ ජයගැනීම උදෙසා නූතන තාක්ෂණයෙන් පෝෂිත, ඉහළ අගය එකතු කිරීමක් සහිතව වැවිලි භෝග සංවර්ධනය
- රටට උපයන විදේශ විනිමය ප්‍රමාණය ඉහළ නැංවීම
- වගාකරුවාගේ ආදායම උසස් මට්ටමකට ගෙන ඒම

අමාත්‍යාංශයීය විෂය පථය

වර්ෂ 2022 අප්‍රේල් 28 දිනැති අංක 2277/53 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව

පර්යේෂණාත්මක විධි ක්‍රමයන්, නව තාක්ෂණික මෙවලම් හා ප්‍රශස්ත භූමිය උපයෝජනය හරහා අගය එකතු කරන ලද නිෂ්පාදන විවිධාංගීකරණය තුළින් අපනයන වෙළඳපොළ ආකර්ෂණය කර ගැනීම ඉලක්ක කර ගනිමින් සමස්ත වැවිලි ක්ෂේත්‍රය නවමානයක් වෙත යොමු කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

වර්ෂ 2022 ජූලි මස 22 දිනැති අංක 2289/43 දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව අමාත්‍යාංශයීය කාර්යයන්

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වැවිලි කර්මාන්ත විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත් වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.
- නාස්තිය හා දූෂණය පිටුදකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමණාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම .
- වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායීතාවය සඳහා අන්තර්ජාතික තරඟකාරීත්වය ඉහළ නැංවීම.
- ජාත්‍යන්තර වෙළෙඳපොළ ඉලක්ක කරගත් වැවිලි භෝග මත පදනම්ව වූ අගය එකතු කළ නිෂ්පාදන සම්බන්ධ කර්මාන්ත නහා සිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම .
- තේ, රබර් කර්මාන්ත සංවර්ධනය, ප්‍රවර්ධනය සහ පර්යේෂණයන්ට අදාළ කටයුතු
- තේ, රබර් හා පොල් වතු කැබලි කර ජනාවාස ඉදිකිරීම උපරිම වශයෙන් සීමා කිරීම.
- වැවිලි භෝග කර්මාන්ත සඳහා නව තාක්ෂණය භාවිතා කිරීම වැඩි කිරීම.
- රාජ්‍ය හා පෞද්ගලික වැවිලි සමාගම් සතු ඉඩම් ද ඇතුළත්ව ආශ්‍රිත භෝග වගා කටයුතු වර්ධනය කිරීම.
- දේශීය හා විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් රබර් ආශ්‍රිත නිෂ්පාදන දිරිගැන්වීම.
- වතු අංශයේ ඉඩම් ක්‍රමවත් උපයෝජනය සඳහා සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කිරීම.
- තේ , රබර් හා පොල් වතු කැබලි කිරීම සම්බන්ධව බලපත්‍ර නිකුත් කිරීම සහ පාලනය කිරීම.
- කුඩා වැවිලි භෝග වගාකරුවන් දිරිමත් කිරීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- පර්යේෂණ ආයතනයන් හා ඒකාබද්ධව වැඩි අස්වනු සහිත ප්‍රභේද ගොවියන් වෙත හඳුන්වා දීමට ක්‍රියා කිරීම.
- නවීන තාක්ෂණය ද භාවිතා කරමින් දේශීය නිෂ්පාදනවල අගය එකතු කිරීම තුළින්, ඉහළ වටිනාකමකින් යුත් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා අපනයන වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීම.
- අගය එකතු කළ නිෂ්පාදන ද ඇතුළුව තිරසර සම්පත් භාවිතය සහ ජෛව ආරක්ෂණය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- බහු භෝග වගාවන් සහ සංගත ගොවිපළ ක්‍රම තුළින් වැවිලි ඉඩම් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සහ එමඟින් නිෂ්පාදනය හා සේවා නියුක්තිය වැඩිකරලීම.

1.4 සංවිධාන සටහන

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය



1.5 අමාත්‍යාංශය යටතේ පවතින අංශ

- ❖ අමාත්‍ය කාර්යාලය
- ❖ ලේකම් කාර්යාලය
- ❖ පාලන අංශය
- ❖ සැලසුම් අංශය
- ❖ ගිණුම් අංශය
- ❖ සංවර්ධන අංශය
- ❖ ප්‍රතිපත්ති හා මෙහෙයුම් අංශය
- ❖ අභ්‍යන්තර විගණන අංශය
- ❖ රබර් වගා සහ සමාගම් වතු ප්‍රතිසංස්කරණ අංශය
- ❖ පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන අංශය
- ❖ සුළු අපනයන භෝග ප්‍රවර්ධන අංශය

1.6 අමාත්‍යාංශයට පැවරුණු රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන

වර්ෂ 2022 ජූලි 22 දිනැති අංක 2289 / 43 දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව අමාත්‍යාංශයට පැවරුණු රාජ්‍ය දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන

ශ්‍රී ලංකා තේ මණ්ඩලය *
තේ පර්යේෂණ ආයතනය *
තේ රබර් සහ පොල් වතු (කැබලි කිරීමේ පාලන) මණ්ඩලය
ජනතා වතු සංවර්ධන මණ්ඩලය
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
තේ ශක්ති අරමුදල
ජාතික වැවිලි කළමනාකරණ ආයතනය *
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය *
සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව
සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව *
රබර් පර්යේෂණ ආයතනය *
ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව
තුරු සවිය අරමුදල *

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව *
ශ්‍රී ලංකා කජු සංස්ථාව *
උක් පර්යේෂණ ආයතනය *
කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය *
සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම
සීමාසහිත හලාවත වැවිලි සමාගම
පොල් වගාකිරීමේ මණ්ඩලය *
පොල් සංවර්ධන අධිකාරිය *
පොල් පර්යේෂණ ආයතනය *
තල් සංවර්ධන මණ්ඩලය *
කිතුල් සංවර්ධන මණ්ඩලය *
කප්රුක අරමුදල *
සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
කන්තලේ සීනි සමාගම
ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්ත සමාගම

* භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබන ආයතන

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති

කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය (STaRR) (රබර් වගා සහ සමාගම් වතු ප්‍රතිසංස්කරණ අංශය යටතේ ක්‍රියාත්මකයි.)	
ව්‍යාපෘති ඇස්තමේන්තුගත පිරිවැය	ඇ. ඩො. මිලියන 65.401 රු.මිලි. 9,401
ව්‍යාපෘති ආරම්භක දිනය	2016.04.26
ව්‍යාපෘති කාල සීමාව	අවුරුදු 06කි. (2016 - 2022) ව්‍යාපෘති කාල සීමාව 2023 ජුනි 30 දක්වා දීර්ඝ කර ඇත .
අරමුදල් දායකත්වය	අන්තර්ජාතික කෘෂිකර්මය සඳහා වන අරමුදල (IFAD), ශ්‍රී ලංකා රජය

කෘෂිකර්ම අංශය නවීකරණ ව්‍යාපෘතිය (ASMP) (සුළු අපනයන භෝග වගා ප්‍රවර්ධන අංශය යටතේ ක්‍රියාත්මකයි.)	
ව්‍යාපෘති ඇස්තමේන්තුගත පිරිවැය	ඇ.ඩො. මිලියන 61.50 රු.මිලි. 9,225
ව්‍යාපෘති ආරම්භක දිනය	2017.03.17
ව්‍යාපෘති කාල සීමාව	අවුරුදු 05කි. (2017-2022) ව්‍යාපෘති කාල සීමාව 2024 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර ඇත.
අරමුදල් දායකත්වය	ලෝක බැංකුව / ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA)

02. පරිච්ඡේදය

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

නව තාක්ෂණය මුසු වූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්තයක් ඇති කිරීම සඳහා අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම සිදු කිරීම සහ නියමිත නීති හා අණපනත්වලට අනුකූලව වැවිලි කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය හා ජාතික අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කරනු ලබන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමුඛ කොටගෙන 2023 - 2026 වර්ෂයන්හිදී පහත සඳහන් ඉලක්ක ළඟාකරගැනීමට අපේක්ෂිතය .

2.1 වැවිලි ක්ෂේත්‍රයේ අපනයන ආදායම් ඉලක්ක (ඇ.ඩො.මිලි.)





භෝග අනුව අපනයන ආදායම් ඉපයීම් හා ඉලක්ක

වැවිලි භෝගය	2022				2023		2024		2025		2026	
	ඉලක්ක		සත්‍ය		ඉලක්ක		ඉලක්ක		ඉලක්ක		ඉලක්ක	
	රු.මිලි.	US$ මිලි.	රු.මිලි.	US$ මිලි.	රු.මිලි.	US$ මිලි.	රු.මිලි.	US$ මිලි.	රු.මිලි.	US$ මිලි.	රු.මිලි.	US$ මිලි.
තේ	332,000.00	1,450.00	411,055.00	1,258.67	390,000.00	1,300.00	410,000.00	1370.00	447,000.00	1,490.00	462,000.00	1,540.00
රබර්	330,000.00	1,025.90	327,277.00	1,018.40	400,000.00	1,101.43	440,000.00	1,211.57	480,000.00	1,321.71	500,000.00	1,377.17
පොල්	263,000.00	820.00	262,934.00	816.99	301,000.00	860.00	331,100.00	946.00	364,000.00	1,040.00	400,750.00	1,145.00
කිතුල්	-	-	84.42	0.27	350.00	1.08	425.00	1.31	500.00	1.54	-	-
තල්	30.00	0.08	22.00	0.06	40.00	0.11	50.00	0.14	60.00	0.16	-	-
කජු	636.00	1.96	223.41	0.70	1,364.00	4.21	2,107.00	6.50	3,004.00	9.27	3,530.00	10.89
කුරුඳු	85,339.23	262.95	74,885.00	227.13	89,920.80	277.06	97,270.52	299.71	102,060.03	314.47	105,369.14	324.66
ගම්මිරිස්	34,034.54	104.87	28,647.42	91.39	38,810.84	119.58	26,968.80	83.10	31,864.55	98.18	31,442.50	96.88
කරාබු නැට්	6,037.99	18.60	6,708.05	20.65	10,189.54	31.40	5,179.29	15.96	9,129.59	28.13	7,070.67	21.79
කොකෝවා	3,286.07	10.13	4,212.43	13.35	3,614.68	11.14	3,975.74	12.25	3,836.15	11.82	3,409.91	10.51
කෝපි	167.68	0.52	172.11	0.56	273.16	0.84	1,981.11	6.10	1,981.11	6.10	2,476.39	7.63
කරදමුංගු	242.06	0.75	151.04	0.46	267.75	0.83	293.45	0.90	319.34	0.98	831.80	2.56
සාදික්කා	7,563.38	23.30	5,416.89	16.13	8,124.58	25.03	8,404.51	25.90	8,964.81	27.62	8,107.27	24.98
වසාවාසි	1,620.05	4.99	1,799.11	5.25	1,693.07	5.22	1,767.45	5.45	1,814.23	5.59	1,859.98	5.73
බුලත්	4,143.43	12.77	5,034.53	15.20	4,143.43	12.77	4,143.43	12.77	4,143.43	12.77	4,770.74	14.70
පුවක්	10,213.88	31.47	21,187.34	63.01	11,202.40	34.52	12,323.46	37.97	13,555.34	41.77	14,222.95	43.82
පැහිරි	78.43	0.24	18.14	0.06	78.43	0.24	78.43	0.24	78.43	0.24	82.55	0.25
ඉහුරු	473.30	1.46	327.81	1.04	507.11	1.56	540.92	1.67	574.73	1.77	487.50	1.50
කහ	386.76	1.19	182.06	0.53	425.97	1.31	469.25	1.45	515.88	1.59	468.59	1.44
වැනිලා	102.77	0.32	49.74	0.16	196.08	0.60	335.37	1.03	479.10	1.48	319.80	0.99
සේර	37.86	0.12	24.54	0.07	39.22	0.12	41.92	0.13	52.40	0.16	69.96	0.22
ගොරකා	255.58	0.79	234.19	0.73	262.35	0.81	270.46	0.83	274.97	0.85	276.47	0.85
මුළු අපනයන ආදායම් එකතුව	**1,079,649.01**	**3,772.41**	**1,150,646.17**	**3,550.81**	**1,262,503.41**	**3,789.43**	**1,347,726.11**	**4,041.41**	**1,474,208.09**	**4,416.49**	**1,547,546.22**	**4,631.57**

2.2 වැවිලි අංශයේ සමස්ත කාර්යසාධනය

❖ තේ ක්ෂේත්‍රයේ කාර්යසාධනය



විස්තරය	වර්ෂ 2021	වර්ෂ 2022		ඉලක්ක		
		ඉලක්ක	සත්‍ය	2023	2024	2025
නිෂ්පාදනය (කි.ග්‍රෑ.මිලි.)	299	325	251	262	275	300
අපනයන ආදායම (රු.මිලි.)	263,353	332,000	411,055	390,000	410,000	447,000
අපනයන ආදායම (ඇ.ඩො.මිලි)	1,324	1,450	1,259	1,300	1,370	1,490
අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.මිලි.)	286	309	250	260	273	298

❖ රබර් ක්ෂේත්‍රයේ කාර්යසාධනය



විස්තරය	වර්ෂ 2021	වර්ෂ 2022		ඉලක්ක		
		ඉලක්ක	සත්‍ය	2023	2024	2025
නිෂ්පාදනය (කි.ග්‍රෑ.මිලි.)	76.88	83.00	70.87	76.00	80.00	83.00
අපනයන ආදායම (රු.මිලි.)	217,352	330,000	327,277	400,000	440,000	480,000
අපනයන ආදායම (ඇ.ඩො.මිලි.)	1,093	1,026	1,018	1,101	1,212	1,322
අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.මිලි.)	84.62	87.00	80.96	85.00	90.00	95.00
අපනයන ප්‍රමාණය (ඒකක)	48,715,574	50,000,000	34,845,001	40,000,000	44,000,000	48,000,000

❖ පොල්, කිතුල් හා තල් ක්ෂේත්‍රයන්හී කාර්යසාධනය





❖ පොල් ක්ෂේත්‍රය

විස්තරය	වර්ෂ 2021	වර්ෂ 2022		ඉලක්ක		
		ඉලක්ක	සත්‍ය	2023	2024	2025
පොල් පැළ නිෂ්පාදනය (පැළ මිලි.)	7.5	5.0	3.18	2.5	2.5	2.5
පොල් අස්වැන්න (ගෙඩි මිලි.)	3,383	3,219	3,391	2,925	3,250	3,350
අපනයන ආදායම (රු.මිලි.)	166,034	301,000	262,934	331,000	364,000	401,000
අපනයන ආදායම (ඇ.ඩො.මිලි.)	834	860	817	946	1,040	1,145

❖ කිතුල් ක්ෂේත්‍රය

විස්තරය		වර්ෂ 2021	වර්ෂ 2022		ඉලක්ක		
			ඉලක්ක	සත්‍ය	2023	2024	2025
අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.)	කිතුල් පැණි	248,915	-	190,585	-	-	-
	කිතුල් හකුරු	150,219	-	68,323	-	-	-
අපනයන ආදායම (රු.මිලි.)		0.256	0.350	0.242	0.425	0.500	-
අපනයන ආදායම (ඇ.ඩො.මිලි)		0.0013	0.0011	0.0007	0.0012	0.0014	

❖ තල් ක්ෂේත්‍රය

විස්තරය		වර්ෂ 2021	වර්ෂ 2022		ඉලක්ක		
			ඉලක්ක	සත්‍ය	2023	2024	2025
තල් නිෂ්පාදන	හකුරු (මෙ.ටො.)	55	75	68	75	78	80
	තල් රා (ලීටර්)	6,500,000	11,000,000	7,508,975	10,000,000	11,000,000	12,000,000
	පල්ප (ලීටර්)	35,000	70,000	52,000	60,000	65,000	70,000
	තල් අල (මෙ.ටො.)	360	410	380	415	420	425
	තල් කෙඳි (මෙ.ටො.)	35	80	48	50	55	60
	අත්කම් (රු.මිලි)	38	60	42	50	55	60
	පනාටු (මෙ.ටො.)	6.0	10	7.2	10	11	12
	තල් අරක්කු (මි.ලි 750 බෝතල්)	210,000	300,000	250,000	400,000	450,000	500,000
	දැව ආශ්‍රිත (නො.)	15,339	10,000	11,800	10,000	10,000	10,000
අපනයන ආදායම (රු.මිලි)		21.00	30.00	22.00	40.00	50.00	60.00
අපනයන ආදායම (ඇ.ඩො.මිලි.)		0.06	0.081	0.06	0.11	0.14	0.16

❖ සුළු අපනයන භෝග ක්ෂේත්‍රයේ කාර්යසාධනය



❖ උක් ක්ෂේත්‍රය

විස්තරය	වර්ෂ 2021	වර්ෂ 2022		ඉලක්ක		
		ඉලක්ක	සත්‍ය	2023	2024	2025
වගා භූමි ප්‍රමාණය (හෙක්.)	24,377	25,880	25,400	26,000	-	-
අස්වැන්න (මෙ.ටො.)	1,290,069	1,532,000	1,279,519	1,550,000	-	-

❖ කජු ක්ෂේත්‍රය

විස්තරය	වර්ෂ 2021	වර්ෂ 2022		ඉලක්ක		
		ඉලක්ක	සත්‍ය	2023	2024	2025
නිෂ්පාදනය (මෙ.ටො.)	6,125	19,391	4,900	22,749	26,999	30,040
අපනයන ප්‍රමාණය (මෙ.ටො.)	26.26	193	58.20	682	1052	1502
අපනයන ආදායම (රු.මිලි.)	0.09	1.57	0.23	0.68	1.05	1.50
අපනයන ආදායම (ඇ.ඩො.මිලි)	0.45	1.96	0.71	2.10	3.25	4.63

❖ සුළු අපනයන භෝග ක්ෂේත්‍රය

භෝගය	භෝග නිෂ්පාදනය (මෙ.ටො)		අපනයන ප්‍රමාණය (මෙ.ටො)	අපනයන ආදායම (රු.බිලි)	අපනයන ප්‍රමාණය (මෙ.ටො) ***	අපනයන ආදායම (රු.බිලි) ***
	2021	2022	2021		2022	
කුරුඳු	22,871.91	23,364	19,194.79	49.89	18,820.62	74.89
කොකෝවා	657.79	709	* 1,745.46	2.27	1,711.27	4.21
කෝපි	2,438.67	2,537	30.47	0.06	50.56	0.17
ගම්මිරිස්	25,046.67	24,029	18,040.39	23.29	11,508.09	24.72
කරදමුංගු	104.06	140	3.93	0.19	3.64	0.15
පැඟිරි	28.56	29	4.09	0.03	2.15	0.02
සාදික්කා සහ වසාවාසි	2,818.10	2,878	2,043.42	4.98	2,347.36	7.22
පුවක්	23,890.20	24,323	10,516.26	8.67	16,977.71	21.19
බුලත්	13,260.74	13,465	3,833.66	3.08	3,908.05	5.03
ඉඟුරු	25,455 (අමු)	25,097	119.66	0.27	130.52	0.33
කහ	65,945 (අමු)	48,869	42.38	0.11	43.42	0.18
කරාබුනැටි	3,837.09	4,088	* 6,486.50	6.98	2,337.85	0.02
වැනිලා	41.71	45.00	1.66	0.03	1.11	0.05
සේර	8.00	8.00	1.61	0.01	2.71	0.02
ගොරකා	3,323.33	25,097	176.34	0.16	90.11	0.23

* ව්‍යවසායකයින් සතු සංචිත පරිමාවන් එකතු වීම.

2.3 2022 වර්ෂයේදී වැවිලි ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකරන ලද ක්‍රියාකාරකම්

තේ ක්ෂේත්‍රය

- තේ කර්මාන්තය මුහුණ දී ඇති අභියෝග ජය ගැනීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ උපදෙස් පරිදි පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ විද්වත් කණ්ඩායමක් විසින් 2021-2025 වර්ෂය දක්වා පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම සකස් කරන ලද අතර, එම සැලැස්මේ අන්තර්ගත 2022 වර්ෂයට අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

- ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ තැරැව්කරුවන් හරහා තේ කර්මාන්තශාලා වෙත සිය තේ දළු සපයන්නන් සඳහා 8% වාර්ෂික පොලී පදනම යටතේ පොහොර මිලදී ගැනීම වෙනුවෙන් කිලෝග්‍රෑමයකට රුපියල් 300.00 ක සහනදායී ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර ඇත. ඒ සඳහා රුපියල් බිලියන 4.5ක් වෙන් කර ඇත.

- පැවති ආර්ථික අර්බුදය හමුවේ තේ කර්මාන්තශාලා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ඉන්ධන සපයා ගැනීමට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මැදිහත්වීම මත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ පවතින බස් ඩිපෝ සහ ප්‍රාදේශීය ඉන්ධන සැපයුම් මධ්‍යස්ථාන හරහා ඉන්ධන ලබා ගැනීමට කටයුතු කර ඇත.

- ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2021 දී ආරම්භ කරන ලද සූර්ය බලශක්ති සහනාධාර යෝජනා ක්‍රමය යටතේ වන ක්‍රියාකාරකම් වැඩිදුරටත් සක්‍රීය කරන ලද අතර, 2022 දෙසැම්බර් අවසානය දක්වා විදුලිබල හා බලශක්ති අර්බුදයට විසඳුමක් ලෙස සූර්ය බලශක්ති ස්ථාපනය කිරීමට කර්මාන්තශාලා 34 ක් සඳහා පොලී සහනාධාරයක් ලබා දීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පහසුකම් සලසා ඇත. 2022 වර්ෂය සඳහා රු. මිලියන 33.44 ක් වෙන් කර ඇත .

- තේ අපනයන ඇසුරුම් වැඩි දියුණු කිරීමේදී හෝ නවීකරණය කිරීමේදී පොලී සහනාධාරයක් ලබා දීම මඟින්, අපනයනකරුවන්ට සහනාධාර ක්‍රමයක් හඳුන්වා දී ඇත. එය ක්‍රියාත්මක කිරීමට 2022 වර්ෂයේ දී, අපනයනකරුවන් 20 දෙනෙකු වෙනුවෙන් යන්ත්‍රෝපකරණ වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 33.88ක් වැය කර ඇත.
- 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ කර්මාන්තශාලා සඳහා තෙතමන මීටර (moisture meter) සහනාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලද අතර, එම යෝජනා ක්‍රමය යටතේ තේ කර්මාන්තශාලා 145 කට අවශ්‍ය තෙතමන මීටර් ලබා ගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 14.66 ක් වැය කර ඇත.
- තේ කම්හල්වල ගුණාත්මක ප්‍රමිතිය ඉහළ නැංවීම වෙනුවෙන්, HACCP සහතික ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහනාධාර ක්‍රමයක් හඳුන්වා දුන් අතර, තේ කර්මාන්තශාලා 6ක සහතිකය ලබා ගැනීම සඳහා සහනාධාර ගෙවීම් ලෙස රුපියල් මිලියන 0.64 ක් වැය කර ඇත.
- අගය එකතු කළ තේ අපනයනය දිරිමත් කිරීම වෙනුවෙන් අගය එකතු කළ තේ (කි.ග්‍රෑ.3ට අඩු) අපනයනකරුවන් සඳහා 5%ක දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය මත සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අපනයනකරුවන් 290කින් අපනයනකරුවන් 92 ක් තෝරාගෙන ඇත.

- රුසියාව තුළ තේ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, ඒ සඳහා අවශ්‍ය නීතිමය රාමුව හා එහි ක්‍රියාත්මක සැලසුම් ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් සකස් කරමින් පවතී. ඒ අනුව, මහජන සම්බන්ධතා ප්‍රවර්ධන කටයුතු රටවල් 21ක් තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම සකස් කර ඇත.

- 2022 ප්‍රංශ තාක්ෂණික ආධාර යටතේ සිලෝන් ටී සඳහා භූගෝලීය තත්ත්ව දර්ශකය ලබා ගැනීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් කටයුතු ආරම්භ කර ඇත.

- ඒ අනුව, මේ වනවිට යුරෝපීය කලාපය තුළ සිලෝන් ටී සඳහා භූගෝලීය තත්ත්ව දර්ශකය අයදුම් කිරීමට අදාළ මූලික කර්තව්‍යයන් සිදු වන අතර ඒ සඳහා ඉල්ලුම් පත්‍රය යුරෝපීය කලාපයට ඉදිරිපත් කිරීමට අවශ්‍ය මූලික පිරිවිතර පොත සකස් කරමින් පවතී. එමෙන්ම, 2023 සැප්තැම්බර් මාසයේදී මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමට අපේක්ෂා කර ඇත.

- " ජාත්‍යන්තර තේ දිනය " නිමිති කරගෙන සමාජ මාධ්‍ය ජාලා හරහා ප්‍රවර්ධන කටයුතු සිදු කරන ලදි. ලොව පුරා පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2021 මැයි 21 දින සිට දින 10ක කාලයක් රටවල් 14 ක් ඉලක්ක කර ගනිමින් සමාජමාධ්‍ය ජාලා ඔස්සේ ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කර ඇත. මීට අමතරව ජපානය, චීනය, ජර්මනිය, ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍ය, තුර්කිය, සෞදි අරාබිය, ඉරානය සහ චිලී යන රටවල් තුළ ද සමාජමාධ්‍ය ජාල හරහා ප්‍රචාරක වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත.

- කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පූර්ණ අධීක්ෂණය යටතේ තේ වගාව සඳහා අවශ්‍ය වන උසස් තත්ත්වයේ තේ පැළ නිෂ්පාදනය කිරීම අරමුණු කර ගනිමින් තේ තවාන් 500 ක් පිහිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර, එම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රතිපාදන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ප්‍රවර්ධන අරමුදලින් ලබා දී ඇත. මෙහි 2022 වර්ෂයේ වියදම රු.මිලි.13.78 කි.

- කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මඟින් 2022 වර්ෂයේ තේ නැවත වගා සහනාධාර යෝජනා ක්‍රමය යටතේ හෙක්ටයාර 3,249.66ක් සඳහා රු. මිලියන 270ක මුදලක් ලබා දී ඇත. තේ අළුත් වගා සහනාධාර ලෙස හෙක්ටයාර 613.94ක් සඳහා රු. මිලියන 18ක් සහ හෝග පුනරුත්ථාපන වැඩසටහන යටතේ තේ පැළ 3,663,776ක් සඳහා රු. මිලියන 44ක් වැය කර ඇත.

- කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මඟින් තේ දළු ගුණාත්මය රැක ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන හා තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීමට රු. මිලියන 5ක් වැය කර ඇත.

- ආසියානු සංවර්ධන බැංකුව (ADB) ණය යෝජනා ක්‍රමය යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ තේ වතු හිමියන්ගේ කෙටිකාලීන හා දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා මුදල් අමාත්‍යාංශය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ සුදුසුකම් ලත් මූල්‍ය ආයතන 13ක සහයෝගීතාවයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

  එක්සත් ජනපද ඩොලර් මිලියන 20 ක නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන මෙම ණය යෝජනා ක්‍රමය සඳහා මුදල් අමාත්‍යාංශය සහ ආසියානු සංවර්ධන බැංකුව එක්ව ණය ගිවිසුමක් අත්සන් කර ඇති අතර 2020 ජනවාරි මස සිට මෙය ක්‍රියාත්මක වේ.

2022.12.31 දිනට ව්‍යාපෘතියේ ප්‍රගතිය

අදියර	වෙන් කර ඇති මුදල් ප්‍රමාණය (රු.මිලි.)		නිකුත් කිරීම (රු.මිලි.)	
	ණය	ප්‍රදාන	ණය	ප්‍රදාන
පළමු අදියර	796.86	50.00	796.86	50.00
දෙවන අදියර	1,231.15	76.94	752.30	49.39
තෙවන අදියර	1,451.60	83.47	483.10	26.22
මුළු එකතුව	**3,479.61**	**210.41**	2,**030.26**	**125.61**

රබර් ක්ෂේත්‍රය

- කුඩා රබර් වතු හිමියන් 6,000ක් සඳහා ධාරිතා ගොඩනැඟීමේ ව්‍යාපෘතිය (RIVER) , ප්‍රංශයේ ksapa සමාගම, ප්‍රංශයේ Michelin සමූහය සහ අමාත්‍යාංශය ඒකාබද්ධ වී මොණරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර සහ මැදගම යන රබර් සංවර්ධන ව්‍යාපෘති කලාපය තුළ ක්‍රියාත්මක කිරීමට මූලික කටයුතු සිදු කර ඇත.

- වෙළෙඳපොළ තුළ උද්ගතව පවතින රබර් මිල අඩුවීමේ ගැටළුව සහ දේශීය රබර් අලෙවි කර ගැනීමේ ගැටළුව සඳහා විසඳුම් ලබා දීම සඳහා වන "දේශීයව නිපදවන රබර් සහ ආනයනික රබර් සඳහා පවතින ඉල්ලුම විධිමත් කිරීම" යන මැයෙන් කමිටුවක් අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සහ රබර් ක්ෂේත්‍රයට අයත් සියලු පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කර, එම කමිටු නිර්දේශ මත පහත සඳහන් කාර්යයන් 2022 වර්ෂයේ සිට සිදු කර ඇත.

    - කර්මාන්ත අංශය සමඟ වෙළෙඳුන් සහ ගොවීන් සම්බන්ධීකරණය කිරීම මඟින් වෙළෙඳපොළ තුළ අලෙවි නොවී පවතින රබර් තොග අලෙවිය කාර්යක්ෂම කිරීම, ඒ යටතේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන රබර් තොග විස්තර වාර 15කදී කර්මාන්ත අංශයට යොමු කිරීම සහ එම තොගය අලෙවි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
    - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දේශීය රබර් මිලදී ගැනීමට කර්මාන්තකරුවන් දිරිමත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.
    - ශ්‍රී ලංකාවේ රබර් සඳහා මහපෙන්වීමේ මිලක් (Guidance Price) සකස් කිරීමට මූලික කටයුතු සිදු කිරීම.
    - ශ්‍රී ලංකාවේ TSR (Technically Specified Rubber) කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා කමිටුවක් පත්කර එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

- 2022.07.06 දින රබර් සංවර්ධන නිලධාරීන් සමඟ පැවති සාකච්ඡාවේ දී මොණරාගල ප්‍රදේශයේ රබර් වගාවන්හි අක්‍රමවත් ලෙස කිරි කැපීම සිදු වන බව නිරීක්ෂණය වූ අතර, එම කාර්යයන් විධිමත් කිරීමට ගොවීන්ව දැනුවත් කිරීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- රබර් වගාව හා ඒ ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතන ඒකාබද්ධ කරමින් අන්තර් ආයතනික සම්බන්ධීකරණ කමිටුව වාර 03ක දී රැස්වී ඇති අතර එහිදී ක්ෂේත්‍රයට අදාළව ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කර ඇත.

- ජාත්‍යන්තර රබර් අධ්‍යයන කණ්ඩායම (IRSG) සහ ස්වභාවික රබර් නිපදවන රටවල සංගමය (ANRPC) විසින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් සඳහා ක්ෂේත්‍රයේ නිලධාරීන්ට සහභාගී වීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දී ඇත.

- කාබන් වෙළඳාම හා සම්බන්ධ ව්‍යාපෘතියේ කටයුතු සිදු කිරීම - කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය (STaRR) යටතේ, GPS තාක්ෂණය යොදා ගනිමින් මොණරාගල හා අම්පාර යන දිස්ත්‍රික්කවල හෙක්ටයාර 2,000ක පමණ ඉඩම්වල මැනීම් කටයුතු සිදු කර ඇත.

පොල්, කිතුල් හා තල් ක්ෂේත්‍ර

- දෙමුහුම් බීජ පොල් නිෂ්පාදනය වැඩිකිරීම සඳහා පොල් පර්යේෂණ ආයතනයේ බීජ උයන් තුළ අත්පරාගිත ගස් සංඛ්‍යාව 1,000 සිට 6,150 දක්වා ඉහළ නැංවීම CIC කෘෂි ව්‍යාපෘතිය සමඟ ඒකාබද්ධව අත්පරාගණ බීජ නිෂ්පාදනය සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

- දීර්ඝකාලීනව සමස්ත ජාතික දෙමුහුම් බීජ පොල් නිෂ්පාදනය මිලියන 1ක් දක්වා ඉහළ නැංවීම ඉලක්ක කර ගනිමින් හලාවත වැවිලි සමාගම සහ කුරුණෑගල වැවිලි සමාගම හා එක්ව නව දෙමුහුම් බීජ පොල් උයන් 2ක් ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු ඉදිරියට කරගෙන යන ලදී. මේ යටතේ කුරුණෑගල වැවිලි සමාගම සමඟ පිහිටුවන ලබන බීජ පොල් උයනේ අක්කර 20ක් සිටුවා අවසන් කර ඇත.

- පෙර වසර වලදී දිවයින පුරා පැවති පොල් පැළ හිඟයට පිළියමක් ලෙස 2022 වර්ෂයේ දී පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් පොල් පැළ මිලියන 5කට අධික සංඛ්‍යාවක් නිෂ්පාදනය කර ඇත.

- පොල් වගාකිරීමේ මණ්ඩලය පැවති වෙබ් අඩවිය www.coconutsrilanka.lk මඟින් තම පොල් ඉඩම් ලියාපදිංචි කිරීම, පොල් හෝ පොල් ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම හෝ මිලදී ගැනීම සරල නව්‍ය ක්‍රමවේද මඟින් පොල් වගාවේ තාක්ෂණික තොරතුරු ලබා ගැනීම යන ආදී වගාකරුවන්ට පහසුකම් සලසා ඇත.

- නව HS කේතය වන 1404.90.93 යටතේ සම්පිණ්ඩනය කරන ලද හා සම්පිණ්ඩනය නොකරන ලද කොහුබත් අපනයනය වෙනුවෙන් සෙස් බදු ලෙස අය කරනු ලබන මෙ.ටො. 1ක් සඳහා වන රු.100 වන මුදලම නව HS කේතය සඳහා ද අයකිරීම සඳහා අනුමැතිය ලබා ගෙන ඇත.

- දකුණු පළාත තුළ ව්‍යාප්තව පවතින පොල් කොළ මැලවීමේ රෝගය මේ වන විට පාලනය කරමින් ඒ හා සම්බන්ධ විවිධ පරීක්ෂණ කටයුතු සිදු කරමින් ඇත.

- සුදු මැස්සා කෘමි උවදුර මර්දනය වැඩසටහන සඳහා පර්යේෂණ සිදු කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම, ඉසින යන්ත්‍ර බෙදා දීම, ජනතාව දැනුවත් කිරීම ආදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු යොදා ඇත.

- UNDP ආයතනය මඟින් ක්‍රියාත්මක කරන ලද Conducting an Assessment on most harmful subsidies to Biodiversity and recommendation for Re - purposing such subsidies in Sri Lanka under the BIOFIN ii යන ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත.

- ජාත්‍යන්තර පොල් ප්‍රජාව (ICC) සම්බන්ධීකරණය කර "50th International COCOTEC Conference" පවත්වා ඇත.

- ගෘහස්ථ පරිභෝජනයේදී ගෙඩි පොල් භාවිතය අවම කිරීමට සහ ආදේශික නිෂ්පාදන භාවිතය වැඩිකිරීමට ජනතාව මුද්‍රිත / දෘශ්‍ය මාධ්‍ය හරහා දැනුවත් කර ඇත.

- ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධනය සඳහා තල් ජීවනෝපාය කරගත් කර්මාන්තකරුවන් වෙනුවෙන් එම කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා මහපෙන්වීමක් වශයෙන් තල් කර්මාන්තය පිළිබඳ කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තවලට යොමු වීම සඳහා දෙමළ බසින් අත්පොතක් නිර්මාණය කිරීම සඳහා අනුමැතිය ලබාදීම සිදු කර ඇත.

- කාර්මික තාක්ෂණික ආයතනික සමඟ සිදු කළ කිතුල් සම්බන්ධ ව්‍යාපෘතිය මෙම වසරේ අවසන් වූ අතර එමඟින් ස්වභාවික රා හා කෘතිම රා හඳුනාගැනීමට හැකි රසායනික මෙවලමක් ඉදිරිපත් කිරීම සිදු කර ඇත.

- කිතුල් ගොවි සමිති සංවිධානය කිරීම හා සවිබල ගැන්වීම සඳහා " ව්‍යවසායකත්ව මනෝවිද්‍යාත්මක ඇසින්" යන මාතෘකාව යටතේ ගාල්ල සහ මහනුවර දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 21 ක ප්‍රතිලාභීන් දෙසියයකට වැඩි පිරිසක් දැනුම්වත් කර ව්‍යවසායකයින් ලෙස සවිබල ගැන්වීම හා කර්මාන්තයේ නියුතු පිරිස් ඒකරාශි කර කිතුල් කර්මාන්තය දියුණු කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රජා පාදක යාන්ත්‍රණයක් ඇති කිරීම සඳහා කටයුතු කර ඇත.

- නෙළුව හා තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකෙහි හඳුනාගත් ව්‍යවසායකයින් සියයකට වැඩි පිරිසක් සහභාගී කර ප්‍රජාපාදක යාන්ත්‍රණයක් ඇති කිරීම සඳහා කටයුතු සිදු කර ඇත.

- තවාන් සංවර්ධනය සහ කිතුල් වගාව ව්‍යාප්ත කිරීම සඳහා ගාල්ල පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගනිමින් පැළ තවාන්කරුවන් 11 දෙනෙකු තෝරාගෙන එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කර එම තෝරා ගත් තවාන් හිමියන්ට 2023 වන විට සුදුසු බීජ ප්‍රභේද ලබා ගැනීමට සුදුසු කිතුල් මල් සොයා ගැනීමට දැනුවත් කර ඇත.

- කිතුල් ව්‍යවසායකයින් සඳහා GMP සහ SLSI සහතික ලබා දීම සඳහා Code Of Practices for Process of Kithul Trical and Juggery සකස් කර දෙන ලෙසට ශ්‍රී ලංකා ප්‍රමිතිකරණ ආයතනයට දන්වා ඇත.

- කිතුල් ආශ්‍රිත සංචාරක සත්කාරක ගම්මාන දෙකක් ඇති කිරීමට කටයුතු කිරීම සඳහා නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ලංකාගම සහ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි බඹරවාන ගම් තුළ තිබෙන ස්වභාවික සෞන්දර්ය මෙන්ම සංචාරක ආකර්ෂණීය වටිනාකම් ඉහළ නිසා දැනටමත් විදේශ සංචාරකයින් සහ දේශීය සංචාරකයින් මෙම ගම්මානවලට පැමිණෙන හෙයින් කිතුල් ආශ්‍රිත සංචාරක සත්කාරක ගම්මාන වශයෙන් වැඩි දියුණු කිරීමට තිබෙන විභවතාව ඉහළය. එම නිසා කිතුල් ආශ්‍රිත සංචාරක ගම්මාන දෙකක් ස්ථාපනය කිරීමට මූලික කටයුතු ආරම්භ කර ඇත.

සුළු අපනයන භෝග ක්ෂේත්‍රය

- 2022 වසරේ අපනයන කෘෂි භෝගයන්ගේ අපනයන ප්‍රමාණය මෙ.ටො 58,129.95ක් වන අතර අපනයන ආදායම රු.මි 149,050.41ක් වේ. අමාත්‍යාංශය හා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රතිඵලයක් ලෙස අපනයන කෘෂි භෝගයන්ගේ වගා වපසරිය ඉහළ නැංවීම සඳහා කටයුතු සිදු කර ඇත.

  තව ද, අපනයන කෘෂි භෝගයන්ගේ නිෂ්පාදන පිරිසැකසුම්කරණය, අගය එකතු කිරීම, විකිණීම සහ අපනයනය යන සම්පූර්ණ අගයදාමය සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැපයීම ද මෙම වැඩසටහන යටතේ සිදු කර ඇත.

- දේශීය දෙමුහුම් බඩඉරිඟු බීජ වගාකිරීම ගොවීන් අතර ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා යුද හමුදාව හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඒකාබද්ධව නියමු ව්‍යාපෘතියක් ලෙස 2022 යල කන්නයේ අක්කර 250ක දේශීය මව් දෙමුහුම් බඩඉරිඟු බීජ වගා කිරීමට සැලසුම් කරන ලදී. බඩඉරිඟු වගාවට අවශ්‍ය යූරියා පොහොර හිඟකම හා සේනා දළඹු උවදුර වැනි බාධක හමුවේ වුව ද 2022 යල කන්නය තුළ දී අක්කර 144 ක සාර්ථකව බඩඉරිඟු වගාව සිදු කර ඇත.

- දේශීය එතනෝල් නිෂ්පාදනය ලීටර් මිලියන 21.63ක වාර්තාගත ප්‍රමාණයකින් ඉහළ නැංවීමට හැකි වී ඇත.

- සී/ස ඇතිමලේ වැවිලි (පුද්.) සමාගම හා සී/ස ගල්ඔය වැවිලි (පුද්.) සමාගම යන ආයතනයන්හි සීනි නිෂ්පාදනයට අමතරව කාබනික පොහොර නිෂ්පාදනාගාර ඉදි කිරීමට කටයුතු කර ඇත.

2.4 වර්ෂය තුළ අනුමත කැබිනට් තීරණ

විස්තරය	කැබිනට් තීරණ සංඛ්‍යාව
තේ ක්ෂේත්‍රය	1
රබර් ක්ෂේත්‍රය	2
පොල් ක්ෂේත්‍රය	1
ආයතන කටයුතු	1
තේ හා රබර් සම්බන්ධ පොදු	2

2.5 2023 වර්ෂයේදී වැවිලි ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට යෝජිත ක්‍රියාකාරකම්

තේ ක්ෂේත්‍රය

- කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මඟින් තේ නැවත වගාව, තේ අළුත් වගාව හා හෝග පුනරුත්ථාපන වැඩසටහන 2023 වර්ෂයේදීත් ක්‍රියාත්මක කිරීමට නියමිතය. තව ද, තේ කර්මාන්තය මුහුණ දී ඇති අභියෝග ජය ගැනීම සඳහා සකස් කරන ලද පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මට අනුව කටයුතු කිරීම.

  තේ පර්යේෂණ ආයතනය මඟින් තේ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය උදෙසා පහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

  - ✓ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සහ ජපානයේ සයිටාමා විශ්ව විද්‍යාලයේ විද්‍යා ඉංජිනේරු උපාධි පාසල (Graduate School of Science and Engineering at Saitama University, Japan) අතර පර්යේෂණ කාර්ය මණ්ඩල සාමාජිකයින් හුවමාරු කර ගැනීම, ආයතනික පර්යේෂණ ව්‍යාපෘති හා අධ්‍යාපන වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, අධ්‍යයන ද්‍රව්‍ය හුවමාරු කර ගැනීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට කෙටුම්පත් කර ඇත.
  - ✓ කුරුඳු එක් කරන ලද තේ දියවැඩියා රෝගීන් කෙරෙහි සායනික අත්හදා බැලීම් සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය සමඟ සහයෝගීතා ගිවිසුමක් අත්සන් කිරීමට නියමිතය.

- ✓ තේ පර්යේෂණ ආයතනය මඟින් 2022 වර්ෂයේ ආරම්භ කරන ලද දේශගුණික වෙනස්වීම්වලට ඔරොත්තු දෙන වැඩිදියුණු කළ බීජ උද්‍යාන ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියටත් පවත්වාගෙන යාම.
- ✓ පෙව පළිබෝධනාශක වැඩි දියුණු කිරීම සහ වාණිජකරණය අරමුණු කරගනිමින් නිෂ්පාදන පහසුකම් ස්ථාපනය කිරීම සඳහා තේ පර්යේෂණ ආයතනය මඟින් ඉටු කරන ලද කාර්යය ඉදිරියටත් පවත්වාගෙන යාම.
- ✓ තේ පර්යේෂණ ආයතනය මඟින් 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ශ්‍රම ඵලදායීතාවය ඉහළ නැංවීම පිණිස ස්වයංක්‍රීයව තේ දළු තෝරා නෙළා ගත හැකි යන්ත්‍රයක් නිර්මාණය කර හඳුන්වාදීමේ ව්‍යාපෘතිය ඉදිරියටත් පවත්වාගෙන යාම.
- ✓ නව තේ ප්‍රභේදවල මව් ශාක පරිශ්‍ර ව්‍යාප්ත කිරීම සඳහා වූ ව්‍යාපෘතිය තේ පර්යේෂණ ආයතනය මඟින් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

රබර් ක්ෂේත්‍රය

- ❖ කුඩා රබර් වතු හිමියන් 6,000ක් සඳහා ධාරිතා ගොඩනැගීමේ ව්‍යාපෘතිය (RIVER ව්‍යාපෘතිය), වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, ප්‍රංශයේ Ksapa සමාගම සහ Michelin Lanka (Pvt) Ltd ඒකාබද්ධ වී ප්‍රංශ රජයේ ප්‍රදානයක් ලෙස මොණරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර සහ මැදගම යන රබර් සංවර්ධන ව්‍යාපෘති කලාපය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.
- ❖ වෙළෙඳපොළ තුළ උද්ගතව පවතින රබර් මිල අඩුවීමේ ගැටළුව සහ දේශීය රබර් අලෙවි කර ගැනීමේ ගැටළුව සඳහා විසඳුම් ලබා දීම සඳහා වන "දේශීයව නිපදවන රබර් සහ ආනයනික රබර් සඳහා පවතින ඉල්ලුම විධිමත් කිරීම" යන මැයෙන් අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් කමිටුවක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.
- ❖ ශ්‍රී ලංකාවේ රබර් සඳහා මඟපෙන්වීමේ මිලක් (Guidance Price) සකස් කර එය ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- ❖ අමාත්‍යාංශයෙහි විෂය පථයට අදාළව රබර් ක්ෂේත්‍රයෙහි අනුබද්ධ ආයතනවල පනත් සංශෝධනය කිරීම.
- ❖ 1956 අංක 11 දරන රබර් පාලන පනත හා 1953 අංක 36 දරන රබර් නැවත වගා සහනාධාර පනත සංශෝධනය කිරීමට අදාළ කටයුතු සිදු කිරීම.
- ❖ රබර් නැවත වගා සහ නව වගා සහනාධාර පනතේ වාරික ගණන සංශෝධනය කිරීම යටතේ පනතට අදාළ නියෝග සංශෝධනයට කටයුතු කිරීම.
- ❖ මොණරාගල ප්‍රදේශයේ රබර් වගාවන්හි අක්‍රමවත් ලෙස කිරි කැපීම සිදුවන බව නිරීක්ෂණය වූ අතර, එම කාර්යයන් විධිමත් කිරීමට ගොවීන්ව දැනුම්වත් කිරීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ❖ රබර් වගා ඉඩම්වල ඵලදායීතාවය වර්ධනය කිරීම සඳහා රබර් ඉඩම් වර්ගීකරණය කිරීමට වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- ❖ රබර් වගාව හා ඒ ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතන ඒකාබද්ධ කරමින් අන්තර් ආයතනික සම්බන්ධීකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම.

- ජාත්‍යන්තර රබර් අධ්‍යයන කණ්ඩායම (IRSG) සහ ස්වභාවික රබර් නිපදවන රටවල සංගමය (ANRPC) විසින් සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් සඳහා ක්ෂේත්‍රයේ නිලධාරීන්ට සහභාගී වීමට අවශ්‍ය කටයුතු සලසා දීම.

- ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය විසින් කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය (STaRR) යටතේ සිදු කරනු ලබන කාබන් වෙළඳාම හා සම්බන්ධ ව්‍යාපෘතියේ කටයුතු සිදු කිරීම.

- තාක්ෂණික වශයෙන් විශේෂීකරණය වූ රබර් (Technically Specified Rubber - TSR) කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා පත් කළ කමිටුවෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

- රබර් කර්මාන්ත මහ සැලැස්ම සමාලෝචනය කර ප්‍රමුඛතාව මත හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

පොල්, කිතුල් හා තල් ක්ෂේත්‍ර

- දෙමුහුම් බීජ නිෂ්පාදනය කිරීම සඳහා කුරුණෑගල වැවිලි සමාගම හා හලාවත වැවිලි සමාගම සමඟ සිදු කරනු ලබන බීජ පොල් උයන් තවදුරටත් සංවර්ධනය කිරීමට නියමිතය.

- CIC සමාගම එක්ව මව්ශාක වැඩිකර ගැනීම සහ පොල් පර්යේෂණ ආයතනයේ බීජ පොල් උයන්වලින් නිෂ්පාදනය කරනු ලබන බීජ පොල් ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා අත්පරාගණ කටයුතු සිදු කිරීම.
- පටක රෝපණය මඟින් පැල නිෂ්පාදනය වැඩි කිරීමට නියමිතය .
- පොල් ක්ෂේත්‍රයේ අපනයන ආදායම ඩොලර් බිලියන 1ට වැඩි අගයක් කරා ළඟාවීමේ ඉලක්කය සඳහා 2023 වර්ෂයේ අපනයන ආදායම් ඉලක්කය ජය ගැනීමට අදාළ උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- පොල් පර්යේෂණ ආයතනය හා රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම අතර අවබෝධතා ගිවිසුම අත්සන් කර රා මදින්නන්ගේ මානව ආකල්ප හා ජීවන තත්ත්වය උසස් කිරීමට කටයුතු කිරීම.

- කප්රුක අරමුදල "කප්රුක ඉසුර" ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහනේ මූල්‍ය ආයතන සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

- ජාත්‍යන්තර පොල් ප්‍රජාවෙහි සාමාජිකත්වය දීර්ඝ කර පවත්වාගෙන යමින් පොල් ක්ෂේත්‍රයට අදාළව ජාත්‍යන්තර සහාය ලබාගැනීම සඳහා ජාත්‍යන්තර පොල් දිනය පැවැත්වීම සහ ජාත්‍යන්තර පොල් ප්‍රජාව (**ICC**) සම්බන්ධීකරණය කර "51st International COCOTEC Conference" පැවැත්වීමට අදාළ කටයුතු සිදු කිරීම.

- ආදර්ශ පොල් උයන්වල හඳුනාගත් ඉඩම් කොටස් ප්‍රශස්ථ පරිභෝජනය තුළින් අතිරේක ආදායමක් ලබාගැනීමට "සණසඋ ජාත්‍යන්තරය" වෙත අතුරු භෝග වගා කිරීම සඳහා කෙටි කාලීනව බදු දීමට අදාළව ඉදිරි කටයුතු සිදු කිරීම.
- "Ceylon Coconut Certificate Mark" සඳහා අනුමැතිය ලබාගැනීමට අදාළ කටයුතු සිදුකිරීම.

- ❖ පොල් වගාවේ පළිබෝධ මර්දනයට අදාළව බලවේග දියර ඉසින යන්ත්‍ර භාවිතා කිරීමට ශ්‍රමිකයන්ට පුහුණු වැඩසටහන් ලබා දීම හා ක්ෂේත්‍ර නිලධාරී සඳහා ඉන්ධන ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා කඩිනම් ව්‍යාපෘතියක් සිදු කිරීම.
- ❖ හලාවත පළුගස්වැව ප්‍රදේශයේ ඒකාබද්ධ පොල් සැකසුම් කලාපයක් ආරම්භ කිරීමට අදාළ කටයුතු සිදු කිරීම.
- ❖ පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් නිෂ්පාදිත පොල් පැළ මිලියන 1.6 ක ප්‍රමාණයක් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මඟින් ජනතාව වෙත ලබාදීමට අදාළ කටයුතු සිදුකිරීම.
- ❖ පොල් ආශ්‍රිත නිෂ්පාදනවලින් ලැබෙන අපනයන ආදායම වැඩි කිරීමට අපනයනකරුවන් ජාත්‍යන්තර අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්වලට යොමු කිරීම.
- ❖ “ Ceylon Coconut ” සන්නාමය ජාත්‍යන්තරව ප්‍රචලිත කිරීම.
- ❖ තල් පර්යේෂණ ආයතනය සහ බංගලාදේශයේ පවතින විශ්ව විද්‍යාලය (කාන්තාවන් සඳහා වූ) සමඟ ඇති කරගත් අවබෝධතා ගිවිසුමට අදාළ අවශ්‍ය නෛතික පසුබිම ලබාදීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
- ❖ කිතුල් නිෂ්පාදකයින් සංවිධානගත කිරීම, මානව කුසලතා සංවර්ධනය, සමාජීය වශයෙන් සවිබල ගන්වා ප්‍රජා පාදක ව්‍යාපාරික යාන්ත්‍රණයක් ගොඩනැඟීම.
- ❖ කිතුල් නිෂ්පාදනය සඳහා දේශීය වෙළෙපොළ ප්‍රවර්ධනය තුළින් කිතුල් කර්මාන්තයේ නියුතු කිතුල් කාර්මිකයන්ගේ සහ කිතුල් නිෂ්පාදන අලෙවිකරණ ව්‍යවසායකයින්ගේ ආදායම් තත්ත්වය වැඩි කිරීම.
- ❖ තාක්ෂණ භාවිතාව තුළින් කාර්මිකයන්ගේ නිෂ්පාදන හැකියාව සවිබල ගැන්වීම සහ කිතුල් කර්මාන්තය ප්‍රමිතිකරණයට ලක් කිරීම.
- ❖ කිතුල් කර්මාන්තයේ තිරසර පැවැත්ම තහවුරු කිරීම උදෙසා කිතුල් ශාක ගෘහස්ත මට්ටමින් සහ වාණිජ මට්ටමින් වගා කිරීම ප්‍රවර්ධනය කර ආදර්ශ කිතුල් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ❖ කිතුල් කර්මාන්තය අනෙකුත් ආර්ථික අංශ සමඟ ඒකාබද්ධ කිරීම තුළින් වටිනාකම එකතු කළ කර්මාන්තයක් ලෙස වැඩි දියුණු කිරීම.

සුළු අපනයන ක්ෂේත්‍රය

- ❖ 2023 වසරේදී ගොරකා, සාදික්කා, වැනිලා, කරදමුංගු, කරාබුනැටි, හා කෝපි වැනි අපනයන වෙළෙඳපොළ වැඩි විභවතාවයක් පවතින නමුත්, අඩු නිෂ්පාදනයක් සිදු වන භෝග සඳහා අපනයන කලාප 30 ක් ස්ථාපනය කිරීම.
- ❖ 2022 වගා කරන ලද දේශීය මව් දෙමුහුම් බඩඉරිඟු වගාවෙන් අපේක්ෂිත කිලෝ ග්‍රෑම් 60,600ක දේශීය බඩඉරිඟු බීජ අස්වැන්න, 2022/2023 මහ කන්නයේ වගා කිරීම සඳහා බඩඉරිඟු ගොවීන් වෙත ලබාදීම.
- ❖ උක් වගාවේ අස්වනු නෙලීමේ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 26,000ක් දක්වා ව්‍යාප්ත කිරීම.
- ❖ ඇල්පිටිය කෘෂි අපනයන කලාපය ස්ථාපනය කිරීම.

- ❖ ගාල්ල පින්නදූව " Cinnamon Gate " කුරුඳු ආශ්‍රිත සංස්කෘතික ප්‍රවර්ධන මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම.
- ❖ කුඩා වැවිලි භෝග ආශ්‍රිත කර්මාන්ත ව්‍යවසාය ප්‍රවර්ධනය

2.6 අමාත්‍යාංශය මඟින් සිදු කරන ලද වෙනත් විශේෂ ක්‍රියාකාරකම්

❖ **ව්‍යාපෘති යෝජනා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.**

- වැවිලි ක්ෂේත්‍රයේ සංවර්ධනය හා ඵලදායීතාවය ඉහළ නැංවීමට අදාළ ව්‍යාපෘති යෝජනා 42ක් නිර්දේශයට යොමු කරන ලදි.

❖ **ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම**

- වැවිලි ක්ෂේත්‍රයට ප්‍රතිපාදන වෙන් වූ ව්‍යාපෘතිවල ප්‍රගතිය ඇතුළත් මාසික වාර්තා බාහිර අමාත්‍යාංශ හා ආයතන වෙත යොමු කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වැවිලි ක්ෂේත්‍රයේ කාර්යසාධනය සහ වර්ෂය තුළ ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳ අර්ධ වාර්ෂිකව තොරතුරු හා දත්ත වාර්තා කිරීම.
- වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රගතිය ඇතුළත් මාසික වාර්තා මහා භාණ්ඩාගාරය වෙත හා වෙනත් ආයතන වෙත යොමු කිරීම.

❖ **අමාත්‍යාංශයීය ප්‍රකාශන සැකසීම**

- අමාත්‍යාංශයීය කාර්යසාධන වාර්තාව (2021) සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට යොමු කිරීම.
- වැවිලි ක්ෂේත්‍රය පිළිබඳ දත්ත ඇතුළත් සංඛ්‍යාලේඛන අත්පොත (2022) සැකසීම.
- පොල් ක්ෂේත්‍රය පිළිබඳ දත්ත ඇතුළත් සංඛ්‍යාලේඛන අත්පොත (2022) සැකසීම.

❖ **ක්‍රියාත්මක සැලසුම් සැකසීම**

- අමාත්‍යාංශයීය ක්‍රියාත්මක සැලැස්ම (2022) හා සංශෝධිත ක්‍රියාත්මක සැලැස්ම සැකසීම.
- අමාත්‍යාංශය සඳහා සෘජුව ප්‍රතිපාදන ලැබෙන සංවර්ධන ව්‍යාපෘතිවල ක්‍රියාත්මක සැලසුම් හා සංශෝධිත ක්‍රියාත්මක සැලසුම් සැකසීම.
- අනුබද්ධ ආයතනවල ක්‍රියාත්මක සැලසුම් සමාලෝචනය හා ක්‍රියාත්මක ප්‍රගතිය පිළිබඳ මෙහෙයුම් කටයුතු සිදුකිරීම.

❖ **විශේෂ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධීකරණය**

- කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය කිරීම.
- අමාත්‍යාංශයට සෘජුව ප්‍රතිපාදන ලැබෙන ව්‍යාපෘතීන්ට අදාළව 2022 ඇස්තමේන්තු හා අතුරු සම්මත ගිණුමේ ඇස්තමේන්තු ඇගයීම හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කිරීම.

❖ **අභ්‍යන්තර විගණනයට අදාළව සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්**

- අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සංඛ්‍යාව 09
- අනුබද්ධ ආයතනයන් සම්බන්ධව සිදුකරන ලද විමර්ශන කටයුතු සංඛ්‍යාව 04
- අනුබද්ධ ආයතනයන් සම්බන්ධව සිදු කරන ලද ක්ෂේත්‍ර සංඛ්‍යාව 01

❖ **අමාත්‍ය මණ්ඩල තීරණ හා ඊට අදාළ ප්‍රගතිය**

අනු අංකය	ගනු ලැබූ විශේෂ ප්‍රතිපත්තිමය තීරණය	ප්‍රගතිය
1.	2022.08.31 දිනැති අංක අමප/22/1134/604/012 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ශ්‍රී ලංකාව තුළ පවතින ආර්ථික අර්බුදය සැලකිල්ලට ගෙන, ජාත්‍යන්තර නියෝජිතායතන වෙත ගෙවන සාමාජික ගාස්තු කළමනාකරණය කිරීමට කටයුතු කිරීම.	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ද උපදෙස් ලබාගනිමින් අදාළ ජාත්‍යන්තර නියෝජිතායතන වෙත ගෙවන දායක මුදල් ගෙවීම් සමාලෝචනය කර නිර්දේශ ලබාදෙන ලෙස විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත දැන්වීම. ඒ අනුව, අමාත්‍ය මණ්ඩල සන්දේශයක් යොමු කිරීමට කටයුතු කිරීම.
2.	2022.06.06 දිනැති අංක අමප/22/0702/518/001 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කොහුබත් සඳහා අළුතින් නිර්මාණය කරන ලද HS කේතය මත අපනයන සෙස් බද්දක් ක්‍රියාත්මක කිරීම.	කොහුබත් සඳහා අලුතින් නිර්මාණය කරන ලද HS කේතය මත අපනයන සෙස් බද්දක් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ තොරතුරු ඇතුළත් කර කෙටුම්පත් කරන ලද ගැසට් නිවේදනය නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීම.
03	අවශ්‍යතාවයන් පරිදි වර්ෂය අවසන් වන විට ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ ගණන (අමාත්‍ය මණ්ඩල සංදේශ 12)	√		
04	ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම (ප්‍රගති සමාලෝචන රැස්වීම් 7)	√		
05	වර්ෂය තුළ අනුමත කරන ලද ක්‍රියාත්මක සැලසුම් (ක්‍රියාත්මක සැලසුම් 7)	√		
06	තේ හා රබර් ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා සම්බන්ධීකරණය කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව (ව්‍යාපෘති 20)	√		
07	වර්ෂය තුළ පිළිතුරු සපයන ලද විගණන විමසුම් ගණන (විගණන විමසුම් 3)	√		
08	මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය වාර්තා ගණන (මූල්‍ය වාර්තා 50)	√		
09	වර්ෂය තුළ නිමකරන ලද ප්‍රසම්පාදන සංඛ්‍යාව (ප්‍රසම්පාදන 10)	√		
10	ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙතින් වර්ෂයේදී අයකරන ලද බදු කුලී ප්‍රමාණය (රු.මිලි. 1,204.906)	√		

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන අංශය
(පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන.... රාජ්‍ය අමාත්‍යාංශය)

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100% - 90%	75% - 89%	50% - 74%
01	ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම (ප්‍රගති සමාලෝචන රැස්වීම් 4)	√		
02	වර්ෂය තුළ අනුමත කරන ලද ක්‍රියාත්මක සැලසුම් (ක්‍රියාත්මක සැලසුම් 50)	√		
03	වාර්ෂික කාර්යසාධන ඇගයුම් පත්‍ර වර්ෂය තුළ අවසන් කිරීම (කාර්යසාධන ඇගයුම් පත්‍ර 149)		√	
04	වර්ෂය තුළ අවසන් කරන ලද පෞද්ගලික ලිපි ගොනු සංඛ්‍යාව (පෞද්ගලික ලිපිගොනු 149)		√	
05	මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ මූල්‍ය වාර්තා සංඛ්‍යාව (මූල්‍ය වාර්තා 1)	√		
06	අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම (අමාත්‍ය මණ්ඩල සංදේශ 6)	√		
07	ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සමාලෝචනය කළ උපක්‍රම සංඛ්‍යාව (උපක්‍රම 75)	√		

සුළු අපනයන භෝග ප්‍රවර්ධන අංශය
(උක්, බඩඉරිඟු.....රාජ්‍ය අමාත්‍යාංශය)

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100% - 90%	75% - 89%	50% - 74%
01	ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම (ප්‍රගති සමාලෝචන රැස්වීම් 6)	√		
02	වර්ෂය තුළ අනුමත කරන ලද ක්‍රියාත්මක සැලසුම් (ක්‍රියාත්මක සැලසුම් 5)	√		
03	කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම. (පුහුණු වැඩසටහන් 2)	√		
04	වාර්ෂික කාර්යසාධන ඇගයුම් පත්‍ර වර්ෂය තුළ අවසන් කිරීම (කාර්යසාධන ඇගයුම් පත්‍ර 44)	√		
05	වර්ෂය තුළ අවසන් කරන ලද පෞද්ගලික ලිපි ගොනු සංඛ්‍යාව (පෞද්ගලික ලිපි ගොනු 44)	√		
06	වර්ෂය තුළ පිළිතුරු සපයන ලද විගණන විමසුම් ගණන (විගණන විමසුම් 7)	√		
07	වර්ෂය තුළ නිමකරන ලද ප්‍රසම්පාදන සංඛ්‍යාව (ප්‍රසම්පාදන 52)	√		
08	විගණන හා කළමනාකරණ රැස්වීම් වර්ෂය අවසන් වන විට පැවැත්වීම (රැස්වීම් 3)	√		
09	මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය වාර්තා ගණන (මූල්‍ය වාර්තා 9)	√		
10	අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම (අමාත්‍ය මණ්ඩල සංදේශ 8)	√		

05. පරිච්ඡේදය

5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100
2	2.4: 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ඵලදාව සහ නිෂ්පාදනය වැඩි කිරීමට උපකාරවන්නා වූ කාලගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ හානිකර කාලගුණ තත්වයන් නියම, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම.	තේ ක්ෂේත්‍රයේ ඵලදායී කෘෂිකාර්මික ක්ෂේත්‍ර ව්‍යාප්තිය සාර්ථක කරගැනීමේ අනුපාතය.		✓	
8	8.2 : විවිධාංගීකරණය, තාක්ෂණය ඉහළ නැංවීම සහ නවෝත්පාදනය තුළින් සහ ඉහළ වටිනාකම් එකතු කරන ලද සහ ශ්‍රමය සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමු කිරීම තුළින් ඉහළ මට්ටමේ ආර්ථික නිෂ්පාදනයක් ලබා ගැනීම.	තේ ක්ෂේත්‍රයේ වගාකරුවන්ගේ කාර්යසාධනය හා නිෂ්පාදන ඉණක්වය ක්‍රියාත්මක කිරීමේ අනුපාතය			✓
9	9.4 : 2030 වන විට යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ කර්මාන්ත තිරසර කිරීම සඳහා නව තාක්ෂණය මඟින් සංවර්ධනය කිරීම. කර්මාන්ත ක්‍රියාවලියේදී සම්පත් කාර්යක්ෂම ආකාරයට භාවිතා කිරීම වැඩිදියුණු කිරීම, පිරිසිදු සහ පරිසරයට සුදුසු ගුණාත්මකභාවයෙන් ඉහළ තාක්ෂණයන් උපයෝගී කරගැනීමට සියලුම රටවල් ඔවුන්ට පවත්නා ධාරිතාවන් අනුව මේ සම්බන්ධයෙන් සියවර ගැනීම.	තේ වගාවේ පාරිසරික තිරසාරභාවය සඳහා ගුණාත්මක බවින් ඉහළ ප්‍රභව බලශක්ති භාවිතාදෙන ලද තේ කර්මාන්තශාලා සංඛ්‍යාව			✓
17	17.11: අවම වශයෙන් සංවර්ධනය වූ රටවලින් ලෝක අපනයනයට සහාය කොටස 2020 වන විට දෙගුණ කිරීමේ ඇක්මණින් යුක්තව, සංවර්ධනය වෙමින් පවත්නා රටවල අපනයන සැළකිය යුතු මටමෙකින් වර්ධනය කිරීම.	ශ්‍රී ලාංකිය තිම් තේ ගෝලීය අපනයන කොටස ඉහළ නම් අපනයනය කළ කිලෝග්‍රෑම් ප්‍රමාණය			✓

රබර් වගා සහ සමාගම් වතු ප්‍රතිසංස්කරණ අංශය
(සමාගම් වතු ප්‍රතිසංස්කරණ..... රාජ්‍ය අමාත්‍යාංශය)

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100
2	2.4: 2030 වන විට හිරුසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ඵලදායී පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ, කාලගුණ විපර්යාස වලට හැඩ ගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ භාණ්ඩාගාර කාලගුණ නත්වයන්, නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක නත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම.	කුඩා මේ ඉඩම්වල සිටුවන ලද මේ නව වගා, නැවත වගා හෙක්ටයාර ප්‍රමාණය (2022)			✓
		සිටුවන ලද රබර් නව වගා/ නැවත වගා හෙක්ටයාර ප්‍රමාණය (2022)			✓
		කුඩා මේ ඉඩම්වල පාළු සිටුවන ලද මේ පැළ සංඛ්‍යාව (2022)			✓
		නිෂ්පාදනය කරන ලද ගුණාත්මකභාවයෙන් ඉහළ මේ පැළ සංඛ්‍යාව (2022)			✓
		නිෂ්පාදනය කරන ලද ගුණාත්මකභාවයෙන් ඉහළ රබර් පැළ සංඛ්‍යාව (2022)			✓
		වගා කරන ලද රබර් අනුරුහොග හෙක්ටයාර ප්‍රමාණය (2022)			✓
12	12.3: 2030 වන විට සිල්ලර සහ පරිභෝජන මට්ටම්වල ඒක පුද්ගල ආහාර අපතේ යාම අවම කිරීම සහ නිශ්චාත් අස්වනු හානි ඇතුළුව නිෂ්පාදන හා සැපයුම් දාමයන්හි සිදුවන්නා වූ අපතේ යාම අවම කිරීම.	වැසි ආවරණ යෙදූ රබර් හෙක්ටයාර ප්‍රමාණය (2022)			✓
		ලබා දුන් භූමියට අනුව සැකසූ කිරි සිහි ගණන (2022)	✓		

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන අංශය
(පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන.... රාජ්‍ය අමාත්‍යාංශය)

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100
2	2.4: 2030 වන විට නිරසර ආහාර නිෂ්පාදන පද්ධති පවැත්වීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ, කාලගුණ වෙනස්වීම් වලට හැඩ ගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ නාගරික කාලගුණ තත්වයන්, නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඛ්ම සහ පසේ ගුණාත්මක තත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම.	සාපේක්ෂ ඵලදායීතාවය ඉහළ නැංවීම තුළින් සහනික කරන නව වගාව, නැවත පැළ සිටුවීම, පාළු පැළ සිටුවීම මඟින් භෞක්ටයාරයකට පැළ නිෂ්පාදනය ඉහළ නැංවීමට ක්‍රියාත්මක කරන ලද පැළ තවාන් සංඛ්‍යාව		✓	
8	8.2: විවිධාංගීකරණය, නාක්ෂණය ඉහළ නැංවීම, සහ නවෝත්පාදනය තුළින් සහ ඉහළ වටිනාකම් එකතු කරන ලද සහ ශ්‍රම්‍ය සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍රය පිළිබඳ අවධානය යොමු කිරීම තුළින් ඉහළ මට්ටමේ ආර්ථික නිෂ්පාදිතයක් ලබාගැනීම.	අගය එකතු කරන ලද නව නිෂ්පාදන සංඛ්‍යාව		✓	
9	9.5: විද්‍යාත්මක පර්යේෂණ වැඩිදියුණු කිරීම, විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ඇතුළු සියලු රටවල කර්මාන්ත අංශයන්හි නාක්ෂණික ධාරිතාවන් ඉහළ නැංවීම. 2030 වන විට නවෝත්පාදනය දිරිගැන්වීම සහ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්හි නියුතු ශ්‍රමිකයන් සංඛ්‍යාව ජනගහණයට සාපේක්ෂව ප්‍රමාණිකව ඉහළ නැංවීම සහ රාජ්‍ය අංශයේ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වූ වියදම් වැඩි කිරීම.	නවීකරණය කරන ලද පොල් තෙල් මෝල් සංඛ්‍යාව		✓	
	9.b: සංවර්ධනය වෙමින් පවත්නා රටවල දේශීය නාක්ෂණ සංවර්ධනය, පර්යේෂණ, සහ නවෝත්පාදනය සඳහා සහාය ලබාදීම, එකිනෙකා අතර කර්මාන්ත විවිධාංගීකරණය සහ නිෂ්පාදනයන් සඳහා වටිනාකම් එකතු කිරීම සඳහා යෝග්‍ය ප්‍රතිපත්ති වාතාවරණයක් සැකසීම.				

සුළු අපනයන භෝග ප්‍රවර්ධන අංශය
(උක්, බඩඉරිඟු..... රාජ්‍ය අමාත්‍යාංශය)

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100
1	1.1: 2030. වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන සියලුම පුද්ගලයින්ගේ අන්න දිවුනාව තුරන් කිරීම. වර්තමාන තක්සේරු අනුව දිනකට ඩොලර් 1.25 ට වඩා අඩුවෙන් ආදායම් ලබන අය අන්න දිළිදු කාණ්ඩයට අයත් වේ.	2025 වන විට අපනයන කෘෂි ව්‍යවසායකයින්ගේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඇමරිකානු ඩොලර් 6,500 දක්වා වැඩි කිරීම.		✓	
2	2.3: 2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ,විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ස්වදේශික ජනයාගේ, ගොවි පවුල් සහ සිවරයින්ගේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ ආදායම්, ඉඩම්වලට ආරක්ෂාකාරීව සහ සමාන ලෙස ප්‍රවේශ වීම් අවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා පුදානයන්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපොළ සහ වටිනාකම් එකතු කිරීම් හා ගොවිපළ නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබා දීම මගින් දෙගුණ කිරීම.	2025 වන විට, ජාතික දළ දේශීය නිෂ්පාදිතය සඳහා අපනයන කෘෂි ක්ෂේත්‍රයේ දැනට පවතින 2% දායකත්වය 4% දක්වා වර්ධනය කිරීම.		✓	
8	8.3: ඵලදායී ක්‍රියාකාරකම්වලට, ශ්‍රමික රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලීත්වයට සහාය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තීන් ප්‍රවර්ධනය කිරීම. මූල්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමට අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර, කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරිගැන්වීම.	කෘෂි අපනයන ක්ෂේත්‍රයේ දැනට පවතින 12%ක කරුණු ව්‍යවසායකත්ව දායකත්වය 2025 දී 30% දක්වා වැඩි කිරීම.		✓	
12	12.3: 2030 වන විට සිල්ලර සහ පරිභෝජන මට්ටම්වල ඒක පුද්ගල ආහාර අපතේ යාම අවම කිරීම සහ පශ්චාත් අස්වනු හානි ඇතුළුව නිෂ්පාදන හා සැපයුම් දාමයන්හි පිදුවන්නා වූ අපතේ යාම අවම කිරීම.	2025 වන විට, ජාතික දළ දේශීය නිෂ්පාදිතය සඳහා අපනයන කෘෂි ක්ෂේත්‍රයේ දැනට පවතින 2% දායකත්වය 4% දක්වා වර්ධනය කිරීම.		✓	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ

- කොවිඩ් තත්ත්වය හා ගෝලීය ආර්ථික අර්බුද මත දේශීය ආර්ථිකයේ මතු වූ දැඩි අර්බුදකාරී තත්ත්ව තුළ හා වෙනත් ක්ෂේත්‍ර සමඟ පැවති ගැටලුකාරී තත්ත්ව තුළ වුව ද , සැලකිය යුතු ප්‍රගතියක් කරා යාමට හැකිවීම.

- දැනට ජාතික වශයෙන් ප්‍රකාශයට පත්ව ඇති තිරසාර සංවර්ධන ඉලක්ක හා දර්ශකයන්ට සම්බන්ධව දැකිය හැකි වැවිලි ක්ෂේත්‍රයේ උප දර්ශක ප්‍රමාණයක් ගොඩනඟා ගැනීමට හැකිවීම.

ඉලක්ක සපුරාගැනීමේ අභියෝග

- අමාත්‍යාංශයීය විෂයපථයන් කෙටිකාලීනව වෙනස් වූ හෙයින් ඉලක්ක නිගමනය කර ඒ සඳහා වූ ස්ථිර දර්ශක ගොඩනඟා ගැනීමේ අපහසුව.
- ජාතික වශයෙන් දායකත්වය සැපයිය හැකි යාවත්කාලීන කළහැකි දත්ත සහිත ඉලක්ක නිශ්චය කිරීමේ අපහසුව.
- වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදන වෙන්වුව ද, අදාළ ව්‍යාපෘති සඳහා අක්මුදල් ලබා ගැනීමේ ගැටළු මෙන්ම වාර්ෂිකව අනුමත වන ව්‍යාපෘති සංඛ්‍යාව සීමා වීම තුළ දර්ශක සාක්ෂාත් කරගැනීමේ අපහසුව.
- කොවිඩ් වසංගත තත්ත්වය සහ 2022 වර්ෂයේ අප්‍රේල් මස සිට මෙරටට බළපෑ ආර්ථික අර්බුදය හේතුවෙන් තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අත්‍යවශ්‍ය වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඇති වූ බාධක
- ගෝලීය දේශගුණික විපර්යාස හා ස්වාභාවික උපක්‍රම, විවිධ ලෙඩ රෝග හා සත්ව හානි මඟින් වගාවන් විනාශ වීම හා ඵලදාව අඩු වීම.
- ගෝලීය ආර්ථික අර්බුදය හා ඉන්ධන අර්බුදය හා දේශීය ආර්ථිකයෙන් මතු වූ ඉන්ධන හා පොහොර සැපයීමේ ගැටළු හේතුවෙන් අපනයන ප්‍රවර්ධනයට බාධාවන් ඇති වී තිබීම.
- විධිමත් වගාවක් ලෙස ස්ථාපිත වී නොමැති සාම්ප්‍රදායික කර්මාන්තයක් වශයෙන් පවතින කිතුල් හා තල් වගාවන් පිළිබඳව, කර්මාන්තකරුවන් පිළිබඳව හා වගාව ආශ්‍රිතව දත්ත නොමැති වීම.
- කෘෂිකාර්මික ශ්‍රම බලකාය සීඝ්‍රයෙන් අඩු වීම හා තරුණ ශ්‍රමිකයන් සීඝ්‍රයෙන් සේවා අංශ වෙත යොමු වීම හේතුවෙන් මෙම වැවිලි ක්ෂේත්‍රයන්ගේ තිරසර සංවර්ධනයක් පවත්වාගෙන යෑමට බාධා ඇති වීම.
- කිතුල් හා තල් වගාවන් ආශ්‍රිතව, විසිරුණු හෝ කුඩා පරිමාණයේ සාම්ප්‍රදායික ගෘහ කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත වී ඇති නිසා මධ්‍යම හෝ මහා පරිමාණයෙන් සංවර්ධනය කිරීමට යාන්ත්‍රීකරණය / තාක්ෂණය යොදා ගැනීමට අපහසු වීම.

06. පරිච්ඡේදය

6. මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

සේවක ගණය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	34	20	(14)
තෘතීයික	6	4	(02)
ද්විතීයික	507	463	(44)
ප්‍රාථමික	46	37	(09)
එකතුව	593	524	69

රබර් වගා සහ සමාගම් වතු ප්‍රතිසංස්කරණ අංශය
(සමාගම් වතු ප්‍රතිසංස්කරණ..... රාජ්‍ය අමාත්‍යාංශය)

සේවක ගණය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	19	08	(11)
තෘතීයික	01	-	01
ද්විතීයික	59	31	(28)
ප්‍රාථමික	15	09	(06)
එකතුව	94	48	46

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන අංශය
(පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන..... රාජ්‍ය අමාත්‍යාංශය)

සේවක ගණය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු /(අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	16	07	(09)
තෘතීයික	01	01	-
ද්විතීයික	34	139	105
ප්‍රාථමික	15	08	(07)
එකතුව	66	155	121

සුළු අපනයන භෝග ප්‍රවර්ධන අංශය
(උක්, බඩඉරිඟු..... රාජ්‍ය අමාත්‍යාංශය)

සේවක ගණය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	18	10	(08)
තෘතීයික	02	-	(02)
ද්විතීයික	33	26	(07)
ප්‍රාථමික	20	12	(08)
එකතුව	73	48	25

6.2 මානව සම්පත් හිඟය හා අතිරික්තය බලපානු ලබන ආකාරය

ඇතැම් තනතුරුවල පුරප්පාඩු පැවතීම හේතුවෙන් ආයතනයේ අපේක්ෂිත ප්‍රතිඵල හා නිමැවුම් ලබා ගැනීමට අසීරු වී ඇත. එහෙත් සමස්ථයක් ලෙස පවත්නා කාර්ය මණ්ඩලය කළමණාකරණය මඟින් අපේක්ෂිත අරමුණු කරා සාධනීය ලෙස ළඟා වී ඇත. දැනට සිටින කාර්ය මණ්ඩලය මඟින් අමාත්‍යාංශයේ රාජකාරි කටයුතු කළමනාකරණය කරගැනීමේ හැකියාවක් පවතී.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු. 000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
කළමනාකරණය හා කාර්යසාධන දර්ශක සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන	2	දින 1	4,000.00		දේශීය	විෂය දැනුම වර්ධනය වීම
ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ විශේෂ පුහුණු වැඩ සටහන	5	දින 1	10,000.00		දේශීය	
බී ගිණුම් පිළියෙල කිරීම	3	දින 1	15,000.00		දේශීය	
බුද්ධිමය දේපළ නීතිය	2	දින 10	26,500.00		දේශීය	
තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතා කර ඵලදායිතාව වර්ධනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන	6	දින 3	30,000.00		දේශීය	
රජයේ ප්‍රසම්පාදන සහ වත්කම් කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව	2	මාස 3	60,000.00		දේශීය	කාර්යක්ෂමතාව ඉහළ යාම
එම් .එස් එක්සෙල් (MS Excel) භාවිතාකර පැතුරුම්පත් (Spread Sheet) සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන	1	දින 1	2,000.00		දේශීය	
තොරතුරු තාක්ෂණ නොවන නිලධාරීන් සඳහා තොරතුරු තාක්ෂණ කුසලතා පාඨමාලාව	2	දින 2	7,000.00		දේශීය	
වැටුප් වැඩසටහන (Payroll System) පිළිබඳ පුහුණුව	2	දින 3	10,000.00		දේශීය	
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම	3	දින 1	15,000.00		දේශීය	නව සංකල්ප පිළිබඳ දැනුම
තොරතුරු තාක්ෂණ හා E - රාජ්‍ය පිළිබඳ පශ්චාත් උපාධි (MBA) පාඨමාලාව	1	වසර 3	4,50.000.00		දේශීය	

වැවිලි ක්ෂේත්‍රයේ කාලගුණික වෙනස්වීම් හා එයට අනුගතවීම් සඳහා ධාරිතාව ශක්තිමත් කිරීම	4	දින 1	8,000.00		දේශීය	මානව සම්පත් සංවර්ධනය
වැවිලි ක්ෂේත්‍රය තුළ පාංශු සංරක්ෂණ ක්‍රම යොදාගැනීම	4	දින 1	8,000.00		දේශීය	
ICBT ආයතනයේ ජාත්‍යන්තර ව්‍යාපාර පිළිබඳ LIM පාඨමාලාව	1	වසර 2	235,000.00		දේශීය	
මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව	1	වසර 2	132,000.00		දේශීය	
ධනාත්මක චින්තනය හා සේවක අභිප්‍රේරණය පිළිබඳ පුහුණු වැඩසටහන	120	පැය 4	59,580.00		දේශීය	සමස්ත කාර්ය මණ්ඩලයේ ධනාත්මක චින්තනය හා සේවක කුසලතා වර්ධනය සඳහා
පුද්ගල හා රැකියා ජීවිතයේ සමතුලිත බව ඇති කිරීම (Family & work life balance) තුළින් සඵලදායී රාජ්‍ය සේවකයෙක්	140	පැය 3	31,870.00		දේශීය	සමස්ත කාර්ය මණ්ඩලයේ පුද්ගල හා රැකියා ජීවිතයේ සමතුලිත බව ඇති කිරීම තුළින් ආයතනයට සේවක දායකත්වය ලබා ගැනීම
රාජ්‍ය ආයතනයක කාර්යාල කළමනාකරණය	160	දින 2	198,735.00		දේශීය	රාජ්‍ය ආයතනයක කාර්යාල කළමනාකරණය
රාජ්‍ය මූල්‍ය කළමනාකරණය	160	දින 2	193,534.00		දේශීය	කළමනාකරණ සේවා නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්ගේ විෂය දැනුම වර්ධනය සඳහා
රාජ්‍ය ආයතනයක විනය කළමනාකරණය	160	දින 2	200,140.00		දේශීය	කළමනාකරණ සේවා නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්ගේ විෂය දැනුම වර්ධනය සඳහා කළමනාකරණ සේවා නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය
කාර්යාල කාර්ය සේවක සේවයේ නිලධාරීන් සඳහා ධනාත්මක චින්තනය තුළින් සඵලදායී රාජ්‍ය සේවකයෙක් බිහි කිරීම	28	දින 1	75,300.00		දේශීය	කාර්යාල කාර්ය සේවක සේවයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය
University of Colombo MBA Alumni Association Knock Knock Conference-2022	1	දින 1	10,000.00		දේශීය	විෂය දැනුම වර්ධනය සඳහා
සිවිල් විශ්‍රාම වැටුප් ගණන් බැලීම හා ගෙවීම් පිළිබඳ පුහුණු වැඩසටහන	2	දින 2	15,000.00		දේශීය	විෂය දැනුම වර්ධනය සඳහා

Certificate Course English for Management	2	දින 10	50,000.00		දේශීය	ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය කර ගැනීම සඳහා
Diploma in Professional English Course -2022	1	මාස 3	80,000.00		දේශීය	ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය කර ගැනීම සඳහා
රජයේ වාහන නඩත්තුව	2	දින 2	10,000.00		දේශීය	වාහන නඩත්තුව පිළිබඳව දැනුම වර්ධනය කර ගැනීම සඳහා
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය	3	දින 2	30,000.00		දේශීය	භාණ්ඩ සමීක්ෂණය පිළිබඳව දැනුම ලබාගැනීම සඳහා
සංවර්ධන නිලධාරීන් සඳහා දෙදින පුහුණු පාඨමාලාව (කාර්යාල කළමණාකරණය හා කාර්යාල ක්‍රම / මුදල් රෙගුලාසි හා ගිණුම් ක්‍රම/ පෞරුෂත්ව වර්ධනය සහ ආකල්ප වර්ධනය)	33	දින 2	330,550.00		දේශීය	විෂය දැනුම වර්ධනය සඳහා
නායකත්ව පුහුණු වැඩමුළුව .	40	දින 1	100,000.00		දේශීය	සාමූහිකත්වය හා ආකල්ප සංවර්ධනය
ධනාත්මක මනෝවිද්‍යාව සහ ආතති කළමනාකරණය	4	දින 2	28,000.00		දේශීය	කාර්යාල පරිසරය තුළ ආතතියකින් තොරව කාර්යාල කටයුතු සිදුකිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම
සේවාරම්භක පුහුණු වැඩමුළුව	3	දින 3	45,000.00		දේශීය	කාර්යාල කටයුතු සිදුකිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම
රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම	3	දින 1	15,000.00		දේශීය	රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම
කාර්යාල සටහන් ලිවීම හා රාජකාරී ලිපි ලිවීම	10	දින 1	50,000.00		දේශීය	කාර්යාල සටහන් ලිවීම හා රාජකාරී ලිපි ලිවීම පිළිබඳ දැනුම ලබා ගැනීම
කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි	9	දින 2	90,000.00		දේශීය	කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම ලබා ගැනීම
රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලොමාව (HN-DIPPCA)	1	මාස 14	60,000.00 (පළමු වාරිකය)		දේශීය	රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ දැනුම ලබා ගැනීම
රාජ්‍ය මුදල් රෙගුලාසි	2	දින 3	36,000.00		දේශීය	මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම ලබා ගැනීම
ලංසු ලේඛන සහ ටෙන්ඩර් පටිපාටිය	1	දින 3	18,000.00		දේශීය	ලංසු ලේඛන හා ටෙන්ඩර් පටිපාටිය පිළිබඳ දැනුම ලබා ගැනීම
කාර්යාල භාවිතය සඳහා ඉංග්‍රීසි	26	දින 3	468,000.00		දේශීය	කාර්යාල කටයුතු සිදුකිරීම සඳහා ඉංග්‍රීසි භාෂා දැනුම ලබා ගැනීම
ලිපි ලිවීම පිළිබඳ පුහුණු වැඩසටහන	3	දින 1	23,250.00		දේශීය	රාජකාරී ලිපි ලිවීම පිළිබඳ දැනුම ලබා ගැනීම

කාර්ය සාධන කළමනාකරණය සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක සැකසීම	1	දින 1	7,750.00		දේශීය	ව්‍යාපෘති සඳහා කාර්ය සාධන දර්ශක පිළියෙල කරන ආකාරය හා එම දර්ශකවලට අදාළව ප්‍රගති මෙහෙයුම් කටයුතු සිදුකරන ආකාරය පිළිබඳ දැනුම ලබා ගැනීම
සංවර්ධන නිලධාරීන්ගේ සහ කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කුසලතා සංවර්ධනය	10	දින 2	100,000.00		දේශීය	ලිපි සැකසීම හා ලිපිගොනුකරණය, පෞරුෂ සංවර්ධනය, මහජන සම්බන්ධතා පිළිබඳ දැනුම ලබා ගැනීම.
හානි පාඩු හා මු.රෙ. 104 යටතේ වූ පරීක්ෂණය	3	දින 1	15,000.00		දේශීය	හානි පාඩු හා මු.රෙ. 104 යටතේ වූ පරීක්ෂණය පිළිබඳ දැනුම ලබා ගැනීම
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය	1	දින 2	10,000.00		දේශීය	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු ප්‍රමිතිගත ආකාරයට සිදුකිරීමට අවශ්‍ය දැනුම ලබාගැනීම
විනය කාර්යය පරිපාටිය	1	දින 3	15,000.00		දේශීය	රාජ්‍ය සේවයේ අදාළ විනය කටයුතු සම්බන්ධයෙන් දැනුම ලබාගැනීම
රජයේ වාහන නඩත්තුව	1	දින 1	5,000.00		දේශීය	අමාත්‍යාංශය සතු වාහන උපරිම කාර්යක්ෂමතාවයෙන් හා අවම පිරිවැයකින් යුතුව පරිහරණය කිරීම හා ඒවායේ ආරක්ෂාව උපරිම කරන අයුරින් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ දැනුම ලබා ගැනීම.
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව රාජ්‍ය නිලධාරීන් විසින් අත්කර ගත යුතු පැය 150 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව (පළමු කණ්ඩායම)	23	36 (පැය 150)	112,500.00		දේශීය	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව රාජ්‍ය නිලධාරීන් විසින් අත්කර ගත යුතු රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගැනීම
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව රාජ්‍ය නිලධාරීන් විසින් අත්කර ගත යුතු පැය 150 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව (දෙවන කණ්ඩායම)	22	දින 11	37,500.00		දේශීය	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව රාජ්‍ය නිලධාරීන් විසින් අත්කර ගත යුතු රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගැනීම

07. පරිච්ඡේදය

7. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූලතා නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.6	වෙනත්	-	-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**		-	-
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	භානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-

4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල වේ	-	-
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ	-	-
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ රැස්වීම් වාර 03ක් පැවැත්වීමට කටයුතු කර ඇත.	වර්ෂය මැද රටේ පැවති අර්බුදකාරී තත්ත්වය හා අමාත්‍යාංශ විෂයය පථය වරින්වර වෙනස්වීම	එළඹිය හැකි බාධක හඳුනා ගනිමින් රැස්වීම් සංවිධානය කිරීම. තාක්ෂණය භාවිතා කර රැස්වීම් පැවැත්වීමට කටයුතු කිරීම .
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ	-	-

8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදුකිරීම	අනුකූල වේ	-	-
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශය මඟින් එලෙස මාස 06කට වඩා අඩු කාලයකදී වාහන භාවිතා කළ නොහැකි වීම හේතුවෙන් අපහරණය කොට නැත.	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ. (කල් බදු අවසන් වී ඇත.)	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94 (I) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ	-	-
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූලවීම	අනුකූල වේ	-	-
12.2	නිහඉටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන නිහඉටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
13	**පොදු තැන්පතු ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම		-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-

14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයන් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ	-	-
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	-	-
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ	-	-
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
17	**මහජනයා වෙත තොරතුරු ඉදිරිපත් කිරීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ.	-	-
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම.	08 වන වගන්තිය අනුකූල නොවේ. 10 වන වගන්තිය අනුකූල වේ	-	වාර්තා ඉදිරි වර්ෂයේදී සකස් කර ඉදිරිපත් කරනු ලැබේ.
18	**පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.	-	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ.	-	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම් 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම.	අනුකූල වේ.	-	-

19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම් 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල නොවේ.	ඉදිරියේදී ඒ සඳහා කටයුතු කරනු ලැබේ.	
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීමට නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ. ජ්‍යෙ.නිලධාරියෙකු පත් කර ඇත.	-	-
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ	-	-

ඇමුණුම

இணைப்பு

Annexure

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PAL/E/MPI/02/22/05

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 29 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

ශීර්ෂය 135- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 135- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට නැති වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂිකව හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට නැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමෙදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව් සැගැයිම.

- මූල්‍ය ප්‍රකාශනවල වපුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
1.6.1.1	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩාගාර පොත් හා අමාත්‍යාංශ පොත් අතර පැවති රු.56,769 ක වෙනස නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	වෙනස නිරවුල් කරගත යුතු වීම

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 හි සඳහන් පරිදි ඒසිඒ-ඩී ආකෘතියේ "අදාල ආකෘතියේ/ ඇමුණුමේ පිටු අංකය" ඇතුළත් කළ යුතු තිරුව වෙනුවට "සටහන්" ලෙස හිස් තිරුවක් ඇතුළත් කර තිබුණු බැවින් ගිණුමේ ආකෘතින් ඇතුළත් පිටු අංක හඳුනාගැනීමට විගණනයේ දී නොහැකි විය.

1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.2.1 ආදායම් නොවන ලැබීම්

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ලැබීම්

සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩාගාර පොත් හා අමාත්‍යාංශ පොත් අතර රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් ශේෂයේ රු.56,769ක වෙනසක් පැවතියද එය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

2.1.1 ආදායම් රැස් කිරීම්

(අ) 1992 වර්ෂයේදී රජයට අයත් එකතුව හෙක්ටයාර් 249.843 ක් වූ ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 ක් වෙත අවුරුදු 53 ක කාලයක් සඳහා බදු කුලී පදනම් මත පවරා දී තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට එම සමාගම් 07කින් රජයට අයවිය යුතු රු.838,042,793ක බදු ආදායම් හිඟව පැවතියද , මු.රෙ.176(2) ප්‍රකාරව භාණ්ඩාගාරය හා එක්ව අප්‍රමාදව හිඟ හිටි ආදායම් එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1995 වර්ෂයේ නොවැම්බර් 27 දින කුරුණෑගල වැවිලි සමාගම සමඟ ඇතිකරගත් අංක 1558 දරන බදුකුලී සංශෝධිත ගිවිසුම් අනුව එදිනට පැවති ශුද්ධ වත්කම් ප්‍රමාණය මත ගණනය කළ බදු මුදල, වසර 53 ක් තුළ වසරකදී සමාන වාරික ඉතරකින් අමාත්‍යාංශය වෙත ගෙවිය යුතු වුවද ශුද්ධ වත්කම් අඩුවීම් මත සමාගම් විසින් වසරකට ගෙවිය යුතු බදු මුදල් අඩුවෙන් ගෙවීම් නිසා 2022 දෙසැම්බර් 31 දිනට රු.277,714,736ක් කුරුණෑගල වැවිලි සමාගමෙන් අයවිය යුතුව තිබෙන අතර , එයින්, රු.116,801,733 ක් වසර 05 කට වැඩි කාලයක සිට හිඟව පවතින බව නිරීක්ෂණය විය. මෙම සමාගම සමඟ ඇති කර ගෙන තිබුණු බදු සංශෝධන ගිවිසුමෙහි 2(a) ඡේදය අනුව එහි සඳහන් නියමිත දිනයන්ට අබණ්ඩව බදු කුලිය ගෙවීම් සඳහා එම සමාගම් එකඟ වී තිබුණද, වසර ගණනාවක සිට එම කොන්දේසිය කඩ කර තිබුණද මෙම ගිවිසුමෙහි 5(c) ඡේදය අනුව දින 07 ක් ඇතුළත දැන්වීමක් ඉදිරිපත් කර බදු ගිවිසුම් අහෝසි කළ හැකි නමුත් අමාත්‍යාංශය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2 වියදම් කළමනාකරණය

2.2.1 ඇස්තමේන්තු කිරීමේ දුර්වලතා

මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කර ඇති බවට ගණන්දීමේ නිලධාරී වගබලා ගත යුතු අතර, එම ඇස්තමේන්තු පදනම්කරගත් වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්කට අනුව නිසි වැඩපිළිවෙලක් යටතේ වියදම් කළ යුතු වුවත් පහත දැක්වෙන කරුණු හේතුවෙන් වාර්ෂික ඇස්තමේන්තු සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය .

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදනයන් පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ.66 මගින් වැය විෂයයන් 09 ක ප්‍රතිපාදන සියයට 70 සිට සියයට 220 දක්වා ප්‍රතිශතයකින් මාරු කර තිබීම.

(ආ) යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීමට වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් රු.1,000,000 ක් වෙන් කර තිබුණු නමුත් අදාල කාර්යය සඳහා යොදා නොගෙන මෙම ප්‍රතිපාදන මුදල් සම්පූර්ණයෙන්ම මු.රෙ.66 මගින් වාහන පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් සඳහා මාරු කර තිබීම.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 05ක් සඳහා සලසා තිබුණු එකතුව රු.15,075,000 ක ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණු අතර පුනරාවර්තන වැය විෂයයන් 31 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 90,101,000 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු. 35,365,035 ක් සියයට 27 සිට සියයට 95 දක්වා වූ සැළකිය යුතු ප්‍රමාණයන්ගෙන් ඉතිරි වී තිබුණි. 2022 වර්ෂයේ පැවති රාජ්‍ය වියදම් කළමනාකරණය වක්‍රලේඛයට අනුව පුනරාවර්තන වියදම් ඉතිරියක් පෙන්නුම් කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් සඳහන් කර තිබීම.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 06ක් සඳහා මු .රෙ.66 යටතේ මාරුකර තිබුණු එකතුව රු.8,585,000 ක ප්‍රතිපාදනවලින් එකතුව රු.2,549,327 ක් අදාල කාර්යයන්හි උපයෝජනය නොකර ඉතිරි වී තිබුණු අතර එය එම කාර්යයන් සඳහා මු.රෙ.66 යටතේ මාරුකර තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 30 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සහ පෞද්ගලික අංශය නියෝජනය කරන ශ්‍රී ලංකා රබර් කර්මාන්ත සංගමය සමඟ එක්ව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහය සමඟ සකස් කරන ලද දස වසරක (2016-2025) රබර් කර්මාන්ත ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා 2016 ජූලි 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අනුමැතිය ලබා දී ව්‍යාපෘති 25ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළද ශ්‍රී ලංකා රබර් මහ ලේකම් කාර්යාලය ස්ථාපිත කර ව්‍යාපෘති 06ක් පමණක් ක්‍රියාත්මක කර ව්‍යාපෘති 19 ක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත අරමුණු ඉටු කරගෙන නොමැති බව නිරීක්ෂණය විය. එසේම ස්ථාපිත කළ ශ්‍රී ලංකා රබර් මහ ලේකම් කාර්යාලයට බදවා ගත් ප්‍රධාන තනතුරු වන මහ ලේකම්, ව්‍යාපෘති කළමනාකරණ විශේෂඥ හා ව්‍යාපෘති ලේකම් ඇතුළු සියළු සහයක තනතුරු වල නිලධාරීන් රැකියාවේ අස්ථිරභාවය, තනතුරු සඳහා බඳවා ගැනීම් අනුමත කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් අදාල තනතුරු වලින් ඉවත්ව තිබුණි.

3.2 පාඩු හා හානි

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අලාභ හානි සිදු වී වර්ෂ 06 ක් වර්ෂ 11 ක් අතර කාලයක් ගත වී ඇති සිද්ධීන් 06 ක් සම්බන්ධයෙන් එකතුව රු.5,221,961ක් වූ පාඩු හා හානිවීම් අයකර ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත කාර්යමණ්ඩලය 826ක් වූ අතර එහි 91ක පුරප්පාඩු හා 22ක අතිරික්ත කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදුනද මෙම ඌනතා හා අතිරික්තතා සඳහා විධිමත් පියවරක් ගැනීමට හෝ කාර්යමණ්ඩල සංශෝධනය කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.



වී.ඩී. සිතා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට



Ministry of Plantation Industries
11th Floor, Sethsiripaya Stage II, Battaramulla,
Sri Lanka